භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 මාර්තු - අප්‍රේල් | 127 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026




ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# ප්‍රේමයේ මුනිවරිය

ගී පද - රවි සිරිවර්ධන
සංගීතය - කසුන් කල්හාර
ගායනය - දුමාල් වර්ණකුලසූරිය.




**ජීවිතේ මහ පුදුම කවි පොත**
**ප්‍රේමයෙන් පුරවා තබන අතරේ**
**අත හැරීමක මිහිර තැවරූ**
**කවි කොතෙක් තිබුණා ද? ඔබ ඇසුරේ**
**කවි කොතෙක් තිබුණා ද? ඔබ ඇසුරේ**

**මිනිස් ගුණ සුවඳින් පහන් වුණු**
**ඔබේ එළියෙන් මම නිවෙන අතරේ**
**ඒ එළිය පතුරා තැනින් තැන**
**ඔබ පහන් දැල්වූ අරුම අඳුරේ**
**ඔබ පහන් දැල්වූ අරුම අඳුරේ**

ලෝකය නම් ගෘහය ගොඩ නැඟී ඇති අඩිතාලම ද, එම ගෘහයට සෙවණ දෙන පියස්ස ද වනාහි "ප්‍රේමය" යි. සැකෙවින් කිවහොත්, ලොව පවතින්නේ ප්‍රේමය නිසා ය. ප්‍රේමය යනු කුමක් ද? ඉතිහාසයේ සෑම කල්හි ම, සිය ක්‍රියාවෙන් ම එය පහදා දුන්, ප්‍රේමයට අගතැන්පත් මුනිවරියක් සිටින බව මෙම හද සංවේදී කරවන ගීතය පැහැදිලි කරයි.

ගිනි ගත් ලොව සෙනෙහෙන් නිවාලන, සසල සිත් නිසල කර සනහන, 'ගැහැනිය' නම් වූ ඒ මුනිවරියට වේශයන් කිහිපයකි: විටෙක සොයුරියක් වන ඇය, තවත් විටෙක පෙම්වතියක් ද, බිරියක් ද, මවක් ද, දියණියක් ද වන්නී ය. මේ ඕනෑ ම භූමිකාවක් තුළ, සතුට දුක සමව දරා ගෙන, අවැසි ඕනෑ ම විටෙක ඈ අත් නොහැර ළඟ සිටින්නේ උතුරා ගලනා ප්‍රේමය නිසා ම ය.

"ප්‍රේමය සියල්ල උසුලයි" (1 කොරෙන්ති 13:7). ශුද්ධ වූ බයිබලයේ එන එම පදය දිවි පුරා, දිවි පුදා රකින ඇය, දරා ගැනීමේ ප්‍රතිමූර්තිය යි. එපමණක් නොවේ. සැබෑ ප්‍රේමය තුළ තිබෙන්නා වූ අත හැරීමේ අධ්‍යාත්මය ප්‍රගුණ කළ ඉසිවරිය ද ඇය යි. අම්මා කෙනෙකු දෙස බලන්න. කුසේ සිටින දරුවාට ජීවිතය දෙන්නට නම්, ඈ තමා හා නව මසක් එක් ව සිටි දරුවා ව අත්හැරිය යුතු ම යි.

රචකයාට අනුව ජීවිතය යනු ආදරය ගැන කවි රැසක් ලියැවුණු පුදුමාකාර කවි පොතකි. එහි පිටුවක් පාසා සෑම කවියක ම තැවරී තිබෙන මිහිරට හේතුව කුමක් ද? අත් හැරීමයි. ප්‍රේමයේ බරසාර ම සුලක්ෂණය ද එය යි. ලබා ගැනීම ම නො වන ප්‍රේමයක අත් හැරීම ද උපේක්ෂාවෙන් දරා ගන්නා ඇය ප්‍රේමය ම රඳවා ගනී. එබඳු කතුන් ප්‍රේමයේ මුනිවරියන් ය.

එලෙස ම, ප්‍රේමයේ මුනිවරිය අඳුරු ලොවක මිනිස්කමේ එළිය විහිදුවන අරුමැති පහනක් වැනි ය. ගැහැනු සිය ජීවිතය පුරා ම ඔවුන්ගේ හද පහනින් අන් අයගේ පහන් දල්වති. මව, බිරිය, දියණිය, සොයුරිය, දුවණිය යන පංච ප්‍රේමයේ මුනිවරියන් අඳුර පරදා සැමට ආලෝකයක් ම වේ. එබඳු කතුන් ප්‍රේමයේ මුනිවරියන් ය. මේ සියල්ල ඔස්සේ අප ඇසිය යුතු තවත් පැනයකි: වත්මන් කාන්තාව, කොයි තරම් නම් ඈ ලෝකයේ "ප්‍රේමයේ මුනිවරිය" බව වටහා ගෙන තිබේ ද?

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව අප සැමගේ ජීවිත කතාවල ප්‍රේමයේ මුනිවරියන් මුණගැසී ඇති. ඔවුන්ගේ ආදර්ශය අනුව යමින් "ප්‍රේමයේ මුනිවර මුනිවරියන්" වීම අපගේ කැඳවීම යි. ප්‍රේමය යනු අල්ලා ගැනීමක් නොව අත්හැරීමක් බවත්, ලබා ගැනීමක් නොව පරිත්‍යාගයන් රාශියක එකතුවක් බවත් කියා දෙන මෙම භාව්‍යමය ගීතය සැබැවින්ම ප්‍රේමයේ මහා කාව්‍යයක් බඳු ය.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2026 මාර්තු - අප්‍රේල්**

ප්‍රකාශනය

නිර්මල මරිය නිකාය

භාරකරු

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහය

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

කවර නිර්මාණය

අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම

නිලුම්ණ හර්ෂාන්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව

3 අනුරාධපුර රදගුරු වසමේ සිව්වන ...
ටී. සුනිල් ප්‍රනාන්දු

4 හෙළිදරව්ව

6 ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ ආදරය
ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

7 සැබෑ වූ ආදරය - රෝහිණී කුමාරි මුවන්දෙණිය

8 ආදරණීය සමාජයක් කරා - වි. ලෙ. පිරිස්

10 චතාරිකය හුදු ... - නීටා අයි. ප්‍රනාන්දු

11 ආදරය තුළ වූ විශ්වාසය - ලැරින් ප්‍රියානි

12 යමෙක් ඔබට කුමක් ... - නිසංකා ප්‍රියදර්ශනී

13 අකීකරු පුතුන් වත් ... - ලි. හියුබට් ඇ. ප්‍රනාන්දු

14 වසර 200කට පෙර ... - එස්. හේමාල් පෙරේරා

15 පරිසරයට ආදරය ... - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු

16 කෙටි කතාව - කැතරින් ගුණවර්ධන

18 පවින් තැවරුණු දෙරණට ... - කාමන් සකුන්තලා
දයා ප්‍රේමය - සපුගස්කන්දේ රංජිත්

19 තෑග්ගෙන් තෑග්ග - රවිඳු ප්‍රශාන්ත සහෝදරතුමා

20 කිතුනු සාහිත්‍යයේ ... - මලින්ත බෝපෙආරච්චි

21 අත් නොහරින ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු

22 **Loving Competition**
Winifreda Wasalathanthrige

24 ඕං එහෙනං - සූරිය මාමා

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 90
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 88 පිළිතුරු හා ජයග්‍රහණ

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළ වන
ඉපැරණි ම සිංහල සඟරාව යි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළ වන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

කොන්දේසි විරහිත සත්‍ය ප්‍රේමාදරයේ සුපැහැදිලි ප්‍රතිබිම්බයකි, ක්‍රිස්තුන් වහන්සේ. දැවී දිය වී අඳුර දුරු කළ සත්‍යය හෙළි කළ ධවල පහනකි, ක්‍රිස්තුන් වහන්සේ. ඒ ප්‍රේමයේ පහන් සිළෙන් දැල්වුණු අපි දු ඒ සුමගේ හවුල්කරුවෝ වන්නෙමු. ඉතින් මේ ප්‍රේමයේ මහා පූජා වීමේ අත් දැකීම අප අවදි කරන්නේ එහි සැබෑ අභිරහස්මය අරුත වටහා ගන්නට ය. මන්ද ඇතැමුන් එය හුදෙක් හැඟීමකට ලඝු කළ ද එය එසේ නොව, එය ක්‍රියාවක් ම වන්නේ ය. පරිත්‍යාගී ක්‍රියාවක් නොමැති තැන ආදරයක් හඳුනා ගන්නට අපට හැකි වන්නේ නැත. ඉතින් මෙවර කවරයේ කතාව අපට පසක් කරන්නේ මතුපිටින් අපට පෙනෙන ප්‍රේමයේ සෙවණැලිවලට මුළා නො වී එහි ගැඹුරු, විටෙක දවාලන, විටෙක නිවාලන, ආන්දෝලනාත්මක ස්වාභාවික සත්‍ය ස්වරූපය වටහා ගන්නට ය.

අචල රූපසිංහ

### භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපෑල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

### BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)
Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# අනුරාධපුර රදගුරු මසමේ සිව්වන රදගුරුතුමන් ලෙස අභිෂේක ලැබූ, අති උතුම් දේව ධර්මාචාර්ය දොන් නිශාන්ත සාගර ජයමාන්න දි.ස.නි. හිමිපාණෝ!



කොළඹ අගරදගුරු පදවියේ පමුණුගම බෝපිටිය මීසමේ, ස්වර්ගස්ථ වූ මොහොට්ටිගේ දොන් නෝබට් සෙබස්තියන් ජයමාන්න මහතා සහ විනිප්‍රිඩා මැටිල්ඩා කළුඅග්ගල මහත්මියගේ දෙවන පුතු ලෙස මොහොට්ටිගේ දොන් නිශාන්ත සාගර ජයමාන්න දරුවා 1970 ජුනි 25 වන දින මෙලොව එළිය දිටී ය. මෙතුමාට වැඩිමල් සහෝදරයෙක් ද, බාල සහෝදරියක් සහ සහෝදරයෙක් ද වෙති. වසර කීපයකට පෙර එතුමාගේ බාල සහෝදරයා ස්වර්ගස්ථ විය. බෝපිටිය රෝමානු කතෝලික පිරිමි විදුහලෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා, අනතුරුව කොටහේන ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය හමාර කළේ ය.

සමිඳු හඬ ඇසී දිව්‍ය සත්ප්‍රසාදීය පැවිදි නිකාය තුළින් තම පැවිදි පූජක ජීවිතය ආරම්භ කිරීමට අපේක්ෂා කළ මෙතුමා, 1993 අගෝස්තු මස 01වන දින පළමු පැවිදි වේද භාර ගනිමින්, 1999 නොවැම්බර් 31 වන දා සදාකාලික පැවිදි වේද භාර ලබා ගත්තේ ය. අම්පිටිය ලංකා අප ස්වාමිදුවගේ ජාතික දෙව්සත්හලින් දර්ශනවාදය සහ දේවධර්මය පිළිබඳ උපාධි ලැබ, 2000 වසරේ මැයි මස 13 වන දින එවකට බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණන් අතින් පූජකවරය ලැබී ය.

මාතලේ ශාන්ත තෝමස් මිසමේ සහායක පියතුමා වශයෙන් සිය පූජක දිවිය ආරම්භ කළ මෙතුමා, පසුව හංවැල්ල හල්ගස්හේන ආධුනිකාරාමයේ අදියුරු පියතුමා ලෙස වගකීම් භාර ගත්තේ ය. 2010 ජනවාරි මස වැඩිදුර අධ්‍යාපනය සඳහා, රෝමයේ තෝමස් ඇක්වයිනාස් (Angelicum) විශ්වවිද්‍යාලයට ඇතුළු වී, එහි දර්ශනවාදය පිළිබඳ ව අධ්‍යාපනය ලබා, 2013 වසරේ දී මෙරටට සැපත් ව, පිටකොටුව සාන්ත පිලිප්නේරි දේවස්ථානයේ සහායක පියතුමන් ලෙස පත්වීම් ලැබී ය. 2013 වසරේ සිට අම්පිටිය ලංකා අප ස්වාමිදුවගේ ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ කථිකාචාර්යවරයකු ලෙස ද, 2021 සිට 2025 පෙබරවාරි දක්වා දර්ශනවාද පීඨයේ පීඨාධිපති ලෙස ද එතුමා අයත් පැවිදි නිකායේ සහෝදරතුමන්ලා පුහුණුවන අම්පිටිය දෙව්සත්හලේ අධ්‍යක්ෂ ධුරය ද හෙබවීය.

2025 වසරේ දී සිය පූජකවරයේ විසිපස් වන ජුබිලිය සැමරූ මෙතුමන්ව, එම වසරේ ම දෙසැම්බර් 16 වන දින අනුරාධපුර නව රදගුරුතුමන් ලෙස ශුද්ධාසනය විසින් පත් කරනු ලැබී ය. රදගුරුවරයේ තේමාව ලෙස උන් වහන්සේ තෝරා ගෙන ඇත්තේ (රෝම 1:17) "විශ්වාසය තුළින් විශ්වාසය කරා" (Ex Fide in Fidem) යන්න ය.

පසුගිය 2026 පෙබරවාරි මස 28 වන දින, අනුරාධපුරය සාන්ත ජෝශප් ආසන දෙව්මැදුරේ දී අනුරාධපුරය නව රදගුරු හිමිපාණන් ලෙස අබිසෙස් ලැබූ, අති උතුම් දොන් නිශාන්ත සාගර ජයමාන්න දි.ස.නි. හිමිපාණන්ට, රජරට පුරවරයේ ආගමික සංහිඳියාව ඇති කරමින්, දේව ජනතාව සමිඳුන් වෙත සමීප කරන සැබෑ එඬේරෙකු වන්නට හැකි වේවා යි, භක්ති ප්‍රබෝධනයේ ශුභාශිංසන !

සටහන - ටී. සුනිල් ප්‍රනාන්දු

# ආදරය හෙළිදරව්ව

ආදරය යනු කිමෙක් දැ යි නිශ්චිත ව නිර්වචනය කිරීම තරමක් අපහසු ය. ඊට හේතුව 'ආදරය' විවිධ පැතිකඩවලට විහිදී ඇති සංකීර්ණ සංවේදනයකි. මනුෂ්‍යයාගේ සිත් තුළ පහළ වන දයාව, කරුණාව, සත්කාරය, පරිත්‍යාගය, විශ්වාසය, තේරුම් ගැනීම, සමාව දීම, කැපවීම, වැයවීම සහ එකමුතුකම මේ ආදි විවිධ ගුණාංගයන් එකට බැඳුණු සංකල්පයකි, ආදරය. ආදරය නොමැති ජීවිතයක්, හිස් බවින්, හුදෙකලාවට හසු වී ජීවිත අර්ථය ව්‍යාකුල වන ජීවිතයකි. ආදරයක් නොමැති තැන පුද්ගලයෙකුට ජීවත් වීමට වුවමනාවක් ඇති නොවේ. ජීවත් වුවත් අක්‍රීය වූ, මැලවුණු, පරවුණු ජීවිතයක් නොමැරී පවතී. ආදරයක් අත් නොවිඳින පවුලක්, සංසයක්, සමාජයක් ජීවිත අරුත ගිලිහී ගිය දුර්වල, ආත්මාර්ථකාමී ඒකකයක් බවට පත් වේ. ඒ නිසා ම සියලු ම ආගම් ආදරයට විශේෂ වැදගත්කමක් ලබා දෙන අතර, කිතු දහමේ ආදරය යනු ආගමික ජීවිතයේ මූලික හරය යි.

කිතු දහමට අනුව "දෙවියන් වහන්සේ ප්‍රේමය" (1 ජොහාන් 4:8). දෙවියන් වහන්සේගේ ස්වභාවය ම ආදරය වන බැවින් උන් වහන්සේ මනුෂ්‍යයාට දක්වන ආදරයට සීමාවක් නැත. කොන්දේසි රහිත සදාකාලික ආදරයකි. මනුෂ්‍යයා පාපයට වැටුණ ද දුර්වල වුව ද, යළි යළිත් පාපයට වැටුණත් දෙවියන් වහන්සේ ඔහුට සහ ඇයට ප්‍රේම කිරීම නවත්තන්නේ නැත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිතයෙන්, ඉගැන්වීම් සහ ක්‍රියා තුළින් පියාණන් වහන්සේගේ ආදරය මනුෂ්‍යයාට කොතරම් ද යන්න ප්‍රත්‍යක්ෂ කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ ජීවත් වූ යුදා සමාජය තුළ 'ආදරයේ' සැබෑ අර්ථය හීන වී ඇති අයුරු උන් වහන්සේ නිරීක්ෂණය කළ සේක. කෙනෙක් තම මුළු හෘදයෙන්, ආත්මයෙන්, මුළු සිතින් දෙවියන් වහන්සේට සහ අසල්වැසියාට ආදරය කරන්න යන්න ව්‍යවස්ථාවේ සඳහන් ව තිබුණි. එහි දී මිනුම් දණ්ඩ වූයේ තමන් තමන්ට ආදරය කරන ආකාරයට මුළු හදවතින් ආදරය කරන්න යන්න යි. එනමුත් ජේසුස් වහන්සේ පැමිණියේ ව්‍යවස්ථාවලිය සම්පූර්ණ කරන්නට යන්න උන් වහන්සේ පවසන සේක. ඒ අනුව ජේසුස් වහන්සේ ඉදිරිපත් කරන මිනුම් දණ්ඩ වනුයේ උන් වහන්සේ ප්‍රේම කළ ආකාරයෙන් ම තම අනුගාමිකයන් ප්‍රේම කළ යුතු බව ය. **"මා ඔබට කළාක් මෙන් ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි"** (ජොහන් 13 : 15). ජේසුස් වහන්සේ කළා වූ ආදරය සමාජයේ සීමා සහ සියලු භේද ඉක්මවා යන ආදරයකි. උන් වහන්සේ දිළිඳු, රෝගී, පාපී, හුදෙකලා සහ සමාජයෙන් ප්‍රතික්ෂේප කළ අය සමඟ සමීප ව කටයුතු කළ සේක. අන්ධයන්ට දෘෂ්ටිය ලබා දුන් සේක. පාපී වූවන්ට සමාව දුන් සේක. ශු. ලූක් තුමාගේ සුබ අස්නේ 15 වන පරිච්ඡේදය සඳහන් වන 'නැති වුණ බැටළුවාගේ', 'නැති වුණ කාසියේ' සහ 'නැති වුණ පුත්‍රයාගේ' උපමා හරහා ක්‍රිස්තුන් වහන්සේ ගෙනෙන පණිවුඩය දේව ආදරය විනිශ්චය කිරීමක් නොව තේරුම් ගැනීමත්, පිළිගැනීමක් සහ බිඳ වැටුණු සම්බන්ධතාව යළි නැවත යථා තත්ත්වයට හෝ ප්‍රතිස්ථාපනය කරන ආකාරය යි.

චතාරිකය අපට ආරාධනා කරන්නේ මනස්ථාපිත හදවතකින් නැවත හැරී එන්නට ය. එලෙස පවසන්නේ ආදරයේ නාමයෙන් කුරුසිය මත සිදු වූ ජේසුස් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය අපව පාපයෙන් ගලවා ගන්නට කරන ලද ජීවිත පූජාවක් නිසා ම ය. මේ ජීවිත පූජාව මනුෂ්‍යයාට විමුක්තිය සහ නව ජීවනයක් ලබා දෙන ලදී.

කිතු දහමේ ආදරය පවුල් ජීවිතය තුළ ද ඉතා වැදගත් ස්ථානයක් ගනී. පවුල යනු සමාජයේ මූලික ඒකකය වන අතර එය ආදරය මත ගොඩ නැඟිය යුතු ය. දෙමව්පියන් දරුවන්ව ආදරයෙන්, අවබෝධයෙන්, පරිත්‍යාගයෙන්, වැයවීමෙන්,

ආදර්ශමත් ව පවුල ගොඩ නැගිය යුතු ය. දරුවන් ද දෙමව්පියන්ට ගෞරවයෙන්, ආදරයෙන්, විශ්වාසවන්තව ආදරයෙන් හැසිරිය යුතු ය. ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර ඇති සම්බන්ධතාව තුළ ද කොන්දේසි රහිත ආදරය, කැපවීම, විශ්වාසවන්තකම, තේරුම් ගැනීම දිනෙන් දින ශක්තිමත් විය යුතු ය.

කිතු දහමේ ආදරයේ තවත් ගැඹුරු ම පැතිකඩකි; සතුරන්ට පවා ප්‍රේම කිරීම. සාමාන්‍ය මිනිස් ස්වභාවය අපට හිංසා කරන, අසාධාරණකම් කරන, අපව විනාශ කරන අයට වෛර කිරීම යි. එහෙත් ජේසුස් වහන්සේ පවසන්නේ වෛරය, වෛරයෙන් නොව ආදරයෙන් ජය ගත යුතු බව ය.

කිතු දහමේ ආදරය සමාජ සේවාවක් සහ දයාවේ මෙහෙවරක් බව ජේසුස් වහන්සේ පවසන සේක. ඕනෑ ම අසරණයකුට උදව් කිරීම අත හිත දීම ජේසුස් වහන්සේට කළ ක්‍රියාවක් වනවා යන්න උන් වහන්සේ අවධාරණය කරන සේක (මතෙව් 25 : 40). ක්‍රිස්තුන් වහන්සේ තම අනුගාමිකයන්ගෙන් බලාපොරොත්තු වන්නේ තමන් වහන්සේ කළා වූ උත්තරීතර ආදරයට සාක්ෂි දැරීම ය.

**"මාගේ ආඥාව නම් මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කිරීම යි. යමෙකු මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත"** (ජොහන් 15 : 12-13).

මේ ආදරය සත්‍ය ලෙස ම ජීවත් කළහොත් සාමයෙන්, එකමුතුකමින්, අනෙකාව බලගන්වමින් මනුෂ්‍ය වටිනාකම් අබිබවා දේව ස්වභාවයේ ගති ලක්ෂණ ජීවත් කරවන ලෝකයක් අපට නිර්මාණය කර ගත හැකි ය.

ඇමරිකාවේ ටෙක්සාස් ප්‍රාන්තයේ වසර 10ක් ඉස්කෝලයක වැඩ කරපු විදුහල්පතිවරයෙක් ජෝන් ස්මිත් විශ්‍රාම යන දවස එදයි. ඉතා යහපත් ආදරණීය මනුෂ්‍යයෙක් ඔහු. ගුරුවරු ළමයි ඇවිදින් කථා පවත්වනවා. ඒ කථා අවසන් වූවාට පසු විදුහල්පති ජෝන් ස්මිත්ගේ කථාව පටන් ගන්නවා. "මේ පාසල මට මගේ ජීවිතය ම වුණා. ඔබ කවුරුවත් දන්නෙ නැති වුණාට මම මේ පාසලට එක දවසක්වත් වරදන්නෙ නැතිව එන්න එක විශේෂ හේතුවක් තිබුණා. මට පසුගිය අවුරුදු 10 පුරාවට ම රමණීය සහ සුන්දර වූ ප්‍රේමයක් තිබුණා මේ පාසල් බිමේ. මා මේ පාසලට ආවේ 1978 ජනවාරි 10. හදවත් සැත්කමක් කරලා මාස 2ක් බෙඩ් රෙස්ට් කරලා. දොස්තර මහත්තයා මට තුන් වේල ම බෙහෙත් ගන්න නියම කළා. මං පාසලට ආ මුල් දවසේ ස්ටාෆ් රූම් එකට ගිහිල්ලා බේත් ගන්න වතුර එකක් ඉල්ලා ගත්තා තේ හදන ලින්ඩාගෙන්. ලින්ඩා කිළිටි ගවුමක් ඇඳගෙන කාමරේ අතු ගගා සිටියේ. මම ලින්ඩාට කිව්වා මම මරණ වරෙන්තුව තියාගෙන ඉන්න මනුෂ්‍යයෙක්. මට උදේටයි දවල්ටයි වතුර වීදුරුවක් තියන්න මගෙ කාමරෙන්. ලින්ඩා අහගෙන සිටියා විතර යි. එදා ඉඳලා අවුරුදු දහයක් එක දිගට ම දවසක්වත් නිවාඩුවක් ගන්නෙ නැතිව මේ ඉස්කෝලෙට මම ආවා. වතුර වීදුරුව හැම දා ම මගේ මේසය උඩ තිබුණා, මට අවශ්‍ය රස්නයට අනුව. සර් බෙහෙත් ටික බිව්ව ද?, සර්ට බඩගිනි ද?, කන්ඩ මොනවා හරි ගෙනත් දෙන්න ද? හැම දා ම ජීවිතයේ ගැඹුරු ම තැන් ස්පර්ශ කළා. මරණ වරෙන්තුව ලියාගෙන ආ මම, මටත් හොරා ලින්ඩාට ආදරය කරන්න ගත්තා. ලින්ඩා මගේ මේසය උඩ තැබුවේ වතුර වීදුරුවේ තිබෙන වතුර පමණක් නොවේ. ඒ වතුර තුළ දයාව, කරුණාව, භක්තිය සියල්ල ම ගැබ් වෙලා තිබුණා. හවසට ගෙදර යන්න කලින් දූරකථනය ගත්ත ම මගේ බිරිඳගෙ සහ දූවරුන්ගෙන් ඇවිල්ල තිබුණෙ පාන් රාත්තල් 2යි, බටර් එක යි. හැබැයි එක ම පණිවුඩයක්වත් තාත්තා බෙහෙත් ටික බිව්ව ද? තාත්තා කෑව ද? අහලා තිබුණෙ නැහැ. අවුරුදු 10ක් මට ජීවත් වන්නට දුන්නට මං මාසෙ හැම පඩියකින් ම යම් මුදලක් ලින්ඩා නමින් ගිණුමට දැම්මා. මා ආරාධනා කරනවා ලින්ඩා සහ ඇයගේ ස්වාමි පුරුෂයාට මේ මුදල් බාර ගන්නා ලෙස. ප්‍රේමය රාගයෙන් විතැන් වෙන්න පුළුවන් කියා මට ඉගැන්නුවේ ලින්ඩා ය. එතැන රාගයක් තිබුණේ නැත. ඉතින් මට සමුගන්න වන්නේ පාසලින් පමණක් නොව, මගෙ ජීවිතයෙන් ම". මෙවන් ආධ්‍යාත්මික බැඳීම් තුළ ආදරය කරන ලින්ඩලා සහ ස්මිත්ලා අප සමාජයේ ද තවමත් මුණ ගැසෙති.

**සංස්කාරක පියතුමා**

# ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ ආදරය



ලෝකය සුන්දරව පවතින්නේ ආදරය මත යි. ආදරය විවිධ ලෙසින් එකිනෙකාගේ හදවත්වලට දැනෙනු ඇත. හදවත තුළ ආදරය පිරී ඇත්නම් සතුට සැනසුම ඉබේ ම ළං වනු ඇත. මුදල් පසුපස හඹා යන ආදරය, දේපල මත හඹා යන ආදරය, රූපය පසුපස හඹා යන ආදරය වැනි ලෞකික දේ කෙරෙහි වන ආදරය තාවකාලික යි. ඒ භෞතික දේ නැති වන විට ආදරය ද සිඳී බිඳී සැඟවී යනු ඇත.

ලෝකයාට ආදරය බෙදා දුන් ආදරය ඉගැන්වූ අති උත්තම ප්‍රේමවන්තයාණෝ අපගේ ආදරණීය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. උන් වහන්සේ ඔබට මට මේ මුළු මහත් ලෝකයාට ම ආදරය කළ සේක. සමිඳාණෝ අපගෙන් කිසි ම ප්‍රතිලාභයක් නොපතා අපට ආදරය කළ සේක. උන් වහන්සේගේ ආදරය තුළ ආත්මාර්ථකාමීත්වය, කෝපය, වෛරය නොතිබුණි. තිබුණේ ප්‍රේමය ම පමණි. ජේසුස් වහන්සේ මිනිසාට ආදරය ගැන ඉගැන්වූ සේක. ආදරය කළ යුත්තේ කෙසේ දැයි කියා දුන් සේක. උන් වහන්සේ තම සේවාවේ මුළු කාල පරාසය තුළ ම කියා දුන්නේ ප්‍රේම කරන අන්දම යි. අපි උන් වහන්සේගේ අනුගාමිකයන් බව ලෝකයා දැන ගන්නේ, අප අපගේ සහෝදරයන්ට දක්වන ප්‍රේමය මත බව සමිඳාණෝ පෙන්වා දුන් සේක.

"නුඹ නුඹට ම ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න".

ක්‍රිස්තුන් වහන්සේ සහෝදර දයාව ගැන ඉතාමත් සරල ලෙස අපට ඉගැන්වූ සේක. අප අපට ම කොතරම් ප්‍රේම කරනවා ද? අප කොතරම් ආදරයකින් අපව ම රැකබලා ගන්නවා ද? අපගේ භෞතික වස්තූන් කොපමණ ආරක්ෂිතව රැක ගන්නවා ද? අප එලෙස ම අසල්වැසියාටත් ප්‍රේම කළ යුතු බව උන් වහන්සේ අපට පෙන්වා දුන් සේක. ඔවුන්ගේ භෞතික වස්තූන් ද අප ආරක්ෂා කළ යුතු බව ද රැක ගත යුතු බව ද අදහස විය.

මේ ආදරය කිරීම ඉතාමත් ලෙහෙසි දෙයකි. නමුත් මීළඟට ක්‍රිස්තුස් වහන්සේ අපව ගෙනියන්නේ ප්‍රේමයේ තවත් පැත්තකට ය. එනම්, "ඔබගේ සතුරන්ට ප්‍රේම කරන්න" (ලූක් 6:27) යනුවෙන් පවසති. බලන්න එය කොතරම් අමාරු කාර්යයක් ද? අපට හිරිහැර කරන, අපට වෛර කරන, අපට පහර දෙන, අපගේ වස්තුව පැහැර ගන්නා අයට ප්‍රේම කරන ලෙස උන් වහන්සේ කියා ඇත. මෙය මනුෂ්‍යයන් ලෙස අපට කොතරම් අමාරු කාර්යයක් ද? මේ ප්‍රේමය අප මනුෂ්‍යත්වය වර්ධනය කර දේවත්වයට ආසන්න වී කළ යුතු දෙයක් නොවන්නේ ද? නමුත් ක්‍රිස්තුස් වහන්සේ පැවසුවේ එලෙස කරන්න කියා ය. සතුරන් කෙරෙහි මෙත් සිත් වඩන ආකාරය ගැන දිගු විස්තරයක් ශු. ලූක් තුමා 6: 27-36 වාර්තා කරයි.

වෛරයෙන් වෛරය නොසංසිඳේ. වෛරයේ ගිනි දැල් ඇති තැනට අපි ප්‍රේමයේ ජල ධාරා වත් කරන්නෙමු නම් ඒ ගිනි දළු නිවී යනු ඇත. වෛරය ඇති තැනට ආදරය එක් කිරීම යි නියම ප්‍රේමය. ප්‍රේම කිරීම ගැන ක්‍රිස්තුස් වහන්සේ අපව තවත් මානයකට රැගෙන යයි. එනම් අපි ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේම කරන්නාක් මෙන් අසල්වැසියාටත් ප්‍රේම කළ යුතු බව යි. අසල්වැසියාට අප යම් ලෙසකට සලකනවා ද ඒ කරන්නේ ක්‍රිස්තුස් වහන්සේට බව උන් වහන්සේ පවසන සේක.

"සැබැවින් ම මම ඔබට කියමි. මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා සුළු තැනැත්තාට වුව ද

ඔබ එසේ කළා නම් ඒ කළේ මට ය" (මතෙව් 25: 40). ප්‍රේමය අප තුළින් අසල්වැසියාටත් ඔවුන් තුළින් අප තුළටත් ගමන් කරන ප්‍රේමයක් විය යුතු යි. ඒ සඳහා අන්‍යයන්ට අප්‍රිය වන, ඔවුනට වේදනා ඇති කරවන ඔවුනට හිරිහැර වන අප තුළ ඇති දුර්ගුණ සියල්ල අප කෙරෙන් ඉවත් කිරීම අවශ්‍ය වනු ඇත. එවිට අප තුළ ඉතිරි වන ප්‍රේමය, ආදරය, සහෝදර දයාව, මානව දයාව, කැපවීම, පරිත්‍යාගය වැනි යහපත් ගුණ ධර්ම මඟින් ලෝකයා ක්‍රිස්තුස් වහන්සේව අප තුළින් දකිනු ඇත.

මේ ආදරය, ප්‍රේමය තවත් අති උත්තම තත්ත්වයකට කිතු සමිඳාණෝ ගෙන ගිය සේක. වඩාත් බැරෑරුම් අවස්ථාවකට අපව පත් කළ සේක. ක්‍රිස්තුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී අවසාන වශයෙන් ප්‍රේමය මෙලෙස අරුත් ගැන්වූ සේක.

"මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" (ජොහන් 15: 12). ක්‍රිස්තුස් වහන්සේ අපට ප්‍රේම කළේ කෙසේ ද? එතුමා අප වෙනුවෙන් තම ජීවිතය ම පූජා කළා නොවේ ද? එවන් ප්‍රේමයක් ලබා දීමට අප සූදානම් ද? අපට ශක්තියක් තිබේ ද? සිතා බලන්න. ක්‍රිස්තුස් වහන්සේ අපව රැගෙන'විත් නතර කළේ කොහේ ද? ඉතා ම උත්තරීතර ප්‍රේමයක් ආසන්නයේ ය. උන් වහන්සේගේ ජීවිත පූජාව මෙන් අපටත් ජීවිත පරිත්‍යාගයක් ආදරයක් අන් අයට දීමට හැකි ද?

බලන්න, පසුගිය විපත් සමයේ දී දහස් ගණන් මිනිසුන් පණ පිටින් වැළලී යද්දී, ඇඳිවත පමණක් ඉතිරි වී සියල්ල විනාශ වී යද්දී තම දිවි පරදුවට තබා මිනිසුන් මුදා ගැනීමට පැමිණියේ කවුරුන් ද? ඒ මිනිස් වෙසින් වූ දෙවියන් යැයි කීවොත් නිවැරදි ය. එය යි ප්‍රේමය; එය යි ආදරය; එය යි සේවය. තම ජීවිතය ගැන නොසිතා තම සගයන් බේරා, සිය පණ පිදූ ගුවන් හමුදා නිලධාරියා පෙන්වූ දයාව ප්‍රේමය කැපවීම ගැන වචනයෙන් කීමට ලිවීමට නොහැකි ය. ජීවිත පරිත්‍යාගය යනුවෙන් අදහස් කරන්නේ අපගේ ජීවිතය බිලි දීම ම නොවේ. අප සතු, අප ආශා කරන ආදරය කරන දේවල් අන්‍යයන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට, ඔවුන්ගේ යහපත වෙනුවෙන් පරිත්‍යාග කිරීම යි. අප දිවි දෙවෙනි කොට අන් අය වෙනුවෙන් පරිත්‍යාගි වෙනවා නම් එතැන ඇත්තේ අති උතුම් ප්‍රේමය යි. මේ ප්‍රේමය ඉතා ම ශ්‍රේෂ්ඨ ආදරයක් වනු ඇත.

19 වන පිටුවට ...

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# සැබෑ වූ ආදරය

තක්සලාවෙන් පිටත
යෞවනයේ මල් අතර
බබළමින් සුවඳින් සැලුණු
දිව්‍ය ලෝකයේ පිපුණු
මදාරා මලක් නොවේ
කිසි දිනෙක ආදරේ...

සිසිල් තුරු වදුලකින්
හෙමි හෙමින් ගලා විත්
ගත සිත ම වෙලා ගත්
සිහිල් වතුරක් නොවේ
කිසි දිනෙක ආදරේ...

හුදෙකලා සැඳෑවක
හදට සැනසුම ගෙනෙන
මිහිරි පැතුමක් නොවේ
කිසි දිනෙක ආදරේ..

සඳ නැඟුණු සැඳෑවක
තරු හෙමින් දිලෙන විට
ලියන කවියක් නොවේ
කිසි දිනෙක ආදරේ...

සඳ නොමැති අමාවක
අඳුරු සෙවණැලි අතර
හදවතට රිදුම් දෙන
මුළාවකි සැබෑ වූ ආදරේ..

**රෝහිණි කුමාරි මුවන්දෙණිය**

# ආදරණීය සමාජයක් කරා...

කිතුනු ඇදහිලිවන්තයන් ලෙස අපේ ඇදහිල්ලේ පදනම මත පිහිටා, ආදරය පිළිබඳ විග්‍රහයක යෙදීමෙන් අප ජීවත් වන සමාජය ආදරණීය සමාජයක් බවට පරිවර්තනය කිරීමේ දූත මෙහෙවරේ මාවත සකසා ගත හැකි වනු ඇත. අපේ ඇදහිල්ලේ අති පූජනීය මූලාශ්‍රයය වන ශුද්ධ වූ බයිබලය පදනමේ පිහිටා විග්‍රහයකට පිවිසෙමු. පැරණි ගිවිසුමේ ජුදා ජනතාවගේ "ආදරය" භාවිතය වූ ආදරය සහ නව ගිවිසුමේ ජේසු අනුගාමිකයන් ප්‍රත්‍යක්ෂ කළ ආදරය නිවැරදිව අවබෝධ කර ගැනීමෙන් අප ජීවත්වන සමාජ සන්දර්භයේ ආදරයේ සරු බීජ වපුරන්නන් බවට පත් වෙමු.

**කොටු කරගත් ආදරය**

පැරණි ගිවිසුමේ අසල්වැසියා ලෙස පිළිගෙන තිබුණේ විස්තෘත පවුලේ ඥාති හවුලේ සමීපතම කණ්ඩායමේ, සමාජ කණ්ඩායමේ වෘත්තීය කණ්ඩායමේ ප්‍රභූ කණ්ඩායමේ, ඉඩම් හිමියන්ගේ කණ්ඩායම් සාමාජිකත්වය යි. මෙම කණ්ඩායම් හඳුන්වා දෙන ලද්දේ "නුඹලාගේ සෙනඟ, සහෝදරයා, නුඹලාගේ ජනයා" ලෙස ය. මෙම කණ්ඩායම් තුළ පැවතියේ තමන්ටම සීමා කරගත් සහයෝගීතාවකි; සහෝදරත්වයකි.

ඔබ ඔබේ සෙනඟ අතර ගතු කේලාම් නොකිය යුතු ය. ඔබේ සහෝදරයාට විරුද්ධව හිතෙහි ක්‍රෝධය තබා නොගත යුතු ය. නුඹ නුඹට ප්‍රේම කරන ලෙස නුඹේ අසල්වැසියාට ප්‍රේම කළ යුතු ය (ලෙවී 16 - 18 පරිශීලනය කර ඇත). තමන්ගේ කොටු කරගත් සහයෝගීතා කණ්ඩායමෙන් පිටස්තර අයව සලකන ලද්දේ තමන්ගේ සතුරන් ලෙස ය. මෙහි දී අත්දැක්කේ ආදරය වෙනුවට වෛරය සහ ක්‍රෝධය යි. මේ නිසා එදා සමාජය කිසිසේත් ආදරණීය සාමකාමී සමාජයක් ලෙස පවත්වා ගැනීමට නොහැකි විය. ජේසුස් වහන්සේ තම දූත මෙහෙවර ක්‍රියාත්මක කරන්නට සිදු වූයේ ආදරය පිටුපාන ගැටුම්කාරී සමාජයක ය.

**විවෘත ආදරය**

කොටු කරගත් ආදරය සීමිත, ආත්මාර්ථකාමී පැවැත්මක් තහවුරු කරයි. මෙම සාතන්ගේ රාජ්‍යයේ පදනම යි. නව ගිවිසුමේ ජේසුස් වහන්සේගේ ප්‍රවේශයක් වූයේ, ආත්මාර්ථය පරාජය කරමින් පරාර්ථය රජ කරවන සැම දෙනා වැලඳ ගන්නා ආදරය ව්‍යාප්ත කිරීම ය. ආදරයේ දේව රාජ්‍යය සමාජය තුළ ගොඩ නැඟීමට ය. "නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න සතුරාට වෛර කරන්නැයි අසා ඇත" (මතෙව් 5 : 43). "එහෙත් මම ඔබට කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න, ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න" (මතෙව් 43 : 44).

"ඔබට ප්‍රේම කරන්නාට පමණක් ප්‍රේම කරන්නේ නම් ඉන් ඔබට නම් කවර ප්‍රශංසාවක් වේ ද? පව්කාරයෝ පවා තමන්ට ප්‍රේම කරන්නන්ට ප්‍රේම කරති" (ලූක් 7 : 32).

මැර කල්ලි ජාවාරම් කල්ලි, හොර කල්ලි අතර ද ඒ ආදරය පවතී. ජේසුස් වහන්සේ ඉල්ලා සිටින්නේ සමස්ත මිනිස් වර්ගයා සමඟ සහයෝගීතා අත්දැකීමකි. එය දේව රාජ්‍යය අත්දැකීමකි. ජේසුස් වහන්සේගේ ආදරය විවෘත ආදරයකි. එය කේවල ආත්මාර්ථකාමී කොටු කරගත් සීමාවන් අභිබවමින් විශ්වීය සහයෝගීතාවක් සහෝදරත්වයක් පතුරවමින් සාතන් සහ ඔහුගේ දූතයන් විසුරුවා හරිති.

**ආදරයේ පදනම**

ක්‍රිස්තුන් වහන්සේ සැබෑ ආදරයේ පදනම පැහැදිලි කර දීම සඳහා යහපත් සමරිතානුවරයාගේ උපමාව (ලූක් 10 : 29 - 37) ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්නේ කේවල, ආත්මාර්ථකාමී පටු බැම් බිඳ දමමින්

සමරිතානුවරයාගේ සතුරන් ලෙස සලකන ලද ජුදා ජාතිකයෙකු හොර මුලකට අසු වී තළා පෙළා අඩපණ කොට පාරේ වැටී සිටියදී දැක කරුණාව දක්වා සහෝදරයෙකු ලෙස සලකමින් ඇප උපස්ථාන කිරීමට ඉදිරිපත් විය. මෙහි දී ඔහු තුළ කරුණාව මතු වූයේ කෙසේ ද?

අනෙකාගේ අවශ්‍යතාවන් සහ අභිලාෂයන් වෙනුවෙන් උණුසුම් සහ හෘදයංගම ප්‍රතිචාරය දැක්වීමේ ජීව ගුණය හදවත තුළ ජනිත වීමෙන් මේ කරුණාව මතු වේ. මෙම කරුණාව මිනිසුන් වැටී ඇති අමානුෂික තත්ත්වයෙන් වඩා මානුෂික තත්ත්වයකට පරිවර්තනය කර ගැනීමට ඔවුන් සමඟ කරනු ලබන සමාජ දේශපාලන ක්‍රියාවලියකට යොමු කරවයි. මේ අනුව කරුණාව හුදු පුද්ගල බද්ධ කරුණාවකට සීමා කර නොගෙන, එය සමාජ කරුණාවක් ලෙස පුළුල් කර ගත යුතු ය.

ක්‍රිස්තියානි සහෝදරත්වය හෙවත් සහයෝගීතාව ගොඩ නැඟෙන්නේ එකිනෙකාට දක්වන අන්‍යෝන්‍ය ආදරය මත ය. මෙම අන්‍යෝන්‍ය ආදරය දක්වන්නෝ සියලු මිනිස් වර්ගයා සමඟ ද ආදරණීය සහයෝගීතාව අත්විඳිති. මා ඔබට ප්‍රේම කරන්නාක් මෙන් ඔබ එකිනෙකා කෙරෙහිත්, අන් සියල්ලන් කෙරෙහිත් ඔබගේ ප්‍රේමය පිරී ඉතිරී යන්නට සලස්වන සේක්වා (1 තෙසලෝනික 3 : 12). ජේසුස් වහන්සේ ආයාචනා කළේ කිසිවෙක් අත නොහරින සහයෝගිතාවකි. ක්‍රිස්තියානි සහෝදරත්වය කේවල, ආත්මාර්ථකාමී, කොටු කරගත් සහෝදරත්වය අභිභවමින් සමාජ සාමය, සංහිඳියාව ගොඩ නගයි. කිතුනුවන්ට පමණක් සීමා නොවන ක්‍රිස්තියානි සහෝදරත්වය, ආගම්, ජාති භාෂා, කුල, දේශපාලන භේද නිසා නොසලකා හරින ලද්දවුන් කිසිදු භේදයකින් තොරව වැලඳගෙන, ඔවුන්ගේ මානව ගරුත්වය අත්විඳීමට බාධා කරන සෑම වෑයමක් ම පරාජය කරයි. මෙය ආදරය අරගලයක් නිසා ප්‍රචණ්ඩත්වය පිටු දකියි.

**පොදු මනුෂ්‍යත්වය**

පොදු ජනතාව තුළ සහ ඔවුන් ඔවුන් අතර පවතින පොදු ධනාත්මක හරයන්ගේ විභවයන් මතු කරන ආදර්ශමත් අත්දැකීම් අපට "ආදරයේ, කරුණාවේ" මහිමය මතු කර පෙන්වති. යුද්ධය දරුණුව පැවති අවදියේ මාන්කුලම් කඳවුර අත්හැර යන එක් යුද හමුදා සෙබළෙක් අතරමං වී මඟක් සොයා යන විට එක් පැලක එළියක් දැක, එහි ගිය විට එහි සිටි ද්‍රවිඩ ජාතික මහලු මිනිසා පැල තුළට ඔහුව වද්දාගෙන තුවාලවලට බෙහෙත් දමා කන්න බොන්න දී සහනයත් සැනසුමත් ලබා දී එළිවන්නට පෙර මෙම සෙබළාව තම පා පැදියේ නංවාගෙන කි.මී. 12 - 20 ත් අතර දුර පදවාගෙන සිංහල ගමක් අද්දරට ගොස් සෙබළාට යන්නට කීය. සෙබළා දණින් වැටී දොහොත් මුදුනේ නමස්කාර කළේ තමන්ගේ කෘතවේදී හදගැස්ම ප්‍රකාශ කරමිනි. මේ ද්‍රවිඩ මහලු මිනිසා සෙබළා අමතා "පුතේ, ඔබේ ජීවිතය මා බේරගත්තා, තුවාලවලට බෙහෙත් දැම්මා සුව වෙයි, නමුත් ඔබ නැවත වරක් යුද පිටියට පැමිණ ත්‍රස්තවාදීන් සමඟ සටන් කරන විට කරුණාකරලා මතක තබා ගන්න හැම ද්‍රවිඩ ජාතිකයෙක් ම ඔබේ සතුරකු නොවන බව" (Road to Nandikadal)

"ආගම... භාෂාව යනාදිය පසුකර ගෙන ගොස් මිනිස් සම්බන්ධතාවල ආදරය බෙදා හදා ගත යුතු ය". එවැනි පුළුල් මානසික යෝග්‍යතාවයක් මිනිසුන් තුළ ඇති වුවහොත් ලෝකය, අපේ දේශයේ සාමය සහ සැනසුම පිරුණු ස්වර්ගයක් වනු ඇත" (LTTE සංවිධානයේ කාන්තා දේශපාලන අංශයේ හිටපු නායිකා තමිලිනී ජෙයකුමාරන්ගේ "තියුණු අසිපතෙන්") ඇය මෙය ප්‍රකාශ කර තිබුණේ සිංහල ගමක ජනතාව ඇයට බුලත් දී මල් පොකුරු පිළිගැන්වූ පුනරුත්ථාපන වැඩසටහනක දී ය. කොටු කරගත් ආදරය පරදවා විවෘත විස්තීරණ ආදරය අස්වද්දමු.

**වි. ලෙ. පීරිස්**

# චතාරිකය හුදු සම්ප්‍රදායික සමයක් නොවේ !



"ගඟක් වේ නම්, එතෙර වන්නට ඒ ගඟ තරණය කළ යුතු ම වේ".

බොහෝ සාහිත්‍යමය ප්‍රකාශනවල දී ජීවිතය, තරණය කළ යුතු ගංගාවකැයි කියැවෙයි. නිවී හැනහිල්ලේ ගලා යන ගංගාවක ඇසට පෙනෙන මානය බොහෝ සෞන්දර්යාත්මක සිතිවිලිවලට ඉඩ හරියි. නමුදු එහි ගැඹුරේ ස්වභාවය එලෙස සුන්දර නොවේ. දිය ගැඹුරේ ගල්පර, දිය සුළි, වේගී ජලධාරා, රොන් මඩ හා මුසු වූ නේක සුන්බුන් ගෙනෙන බියකරු බව අමතක කළ හැකි ද නොවේ. දණහිස් පොව්වන මානය ගැන දැන ගඟක ගති - හැටි සොබා තීරණය කිරීම අනුවණකමකි. එතෙර වන්නට නම් ! ජල යාත්‍රාවක පිහිට පැතිය යුතු ය. නැතිනම් පිහිනුම් දත යුතු ය.

කිතුනු ජීවිත භූමිකාව තුළ පාපය නම් වූ මහා බාධකය තරණය කරන්නට බොහෝ මං අපට විවර ව ඇත. පැරණි හා නව ගිවිසුම් එනම් සුපුවත මතින් ජීවිත ගමන දැහැමියාව වෙත සමීප කරනට සැපයෙනුයේ මහා සවියෙකි. වඩාත් ම නව ගිවිසුම ගෙනෙන 'සුබාරංචි' ආත්මගත කර ගත් කල කිතුනු ජීවිත අරුත සාක්ෂාත් කරගන්නට ලැබෙනුයේ මහා පන්නරයකි. කිතු උපත පිළිබඳව දේව දූතයා වෙතින් ලැබෙන සග පණිවිඩය මරියාවන් භාර ගත් අයුරු විමසා බලද්දී ඇදහිල්ලට යා වූ, කීකරුකමේ හා බැහැපත්කමේ හදෙක මහිමය හොඳින් ම පසක් වේ. මවක ලෙසින්, බිරිඳක ලෙසින් එතුමිය නේක වූ අභියෝග දරන්නී බෙදා ගැනීමේ සංවේදීත්වය අපට මහා ආදර්ශයකි. සමාජගත දිවිය තුළ පෑ දායාර්ද්‍ර බවට හොඳ ම උදාහරණය වන්නේ 'කානාහි විවාහ මංගල ගෘහය' යි. එතුමියගේ ආයාචනය තුළ, විශ්වාසය විය. පරාර්ථය ද විය. මානව දයාව ලෙස ප්‍රකට කෙරෙන ඒ සද්ගුණයට කිතු සමිඳුන් ප්‍රතිචාර දැක්වූයේ 'එතෙර' කිරීමකිනි. කුරුසිගත දිවි පිදුමේ දී පවා මාතෘත්වයේ වේදනා හද දරා ගනිමින් දේව සැලසුමට ඉඩ හැරී දේව අම්මා 'ගැලවීමේ' කාර්යයේ කොටස්කාරිනිය වෙමින් ඉවසන්නී; හඬා දොඩා විලාප තැබූ බවෙක් කිසි තැනෙක සඳහන් නොවේ.

ගැලවීම හෙවත් විමුක්තිය මොන තරම් ප්‍රබල අත්විඳීමක් ද? කිතු සමිඳුන් හා බරබ්බස් සමව ගෙන ජුදයින් නිදහස් කර ගන්නට මහත් තැතක් දැරූයේ බරබ්බස් වෙනුවෙනි. දේව බල මහිමය ප්‍රකට නො කර ම, ගැලවී ගන්නට බරබ්බස්ට ඉඩ ලැබුණේ, ඉඩ සැලසූයේ දෙව් පිය සැලසුමට ඉටු වන්නට ජේසු සමිඳුන් කළ අදිටන නිසාවෙනි. කුරුසගත දිවි පිදුම ඇරඹීමේ දී ගැලවීම එල දැරුවේ එලෙස යැයි සිතිය හැකි ය. ඔහු සිත වෙනස් කර ගෙන සිය ජීවිතය වෙනස් කර ගත්තේ දැ යි අපි නොදනිමු. යළිදු, කුරුසගත ව සිටිය දී 'දකුණේ' සොරාට පෑ මහා කරුණා දයාව මනස්ථාපනයෙන් එතෙර වන්නට සග මඟ දකින්නට කළ පූර්වාදර්ශයක් මැ යි.

එළැඹෙන චතාරික සමය කිතුනු හදවත්වලට තම අධ්‍යාත්මයට 'එබී' බලන්නට ලැබෙන වරප්‍රසාදීය කාල පරාසයකි. සුපුවත හා බැඳෙමින් මනස්ථාපනයෙන් යළි හැරෙමින් ආත්ම විමුක්තිය ලබන්නට මහඟු ම කාලයකි. සැම දා ප්‍රකට කළ යුතු, එහෙත් අමතක ව ගිය දයාවේ, පරාර්ථයේ ක්‍රියාවලට අවතීර්ණ වන්නට අවදි කිරීමක් යැයි ද අර්ථ දක්වා ගනිමු. ගඟකින් එතෙර වීමට තාක්ෂණික උපක්‍රම බොහෝ ය. පාපයෙන් එතෙර වන්නට පටු - රළු මාවත් හරහා ගමන් කළ යුතු ය. පාපයෙන් එතෙරව ලබන නිරාමිස සුවය අන් කිසිවකට සම කළ නොහේ.

නීටා අයි. ප්‍රනාන්දු
කඳාන.

# ආදරය තුළ වූ විශ්වාසය

දෙවියන් වහන්සේගේ ආදරයට අපි හිමිකම් කියන බවට ඇති ස්ථිරත්වය, ආධ්‍යාත්මික ජීවිතයේ වඩාත් වැදගත් කරුණු අතරින් එකකි. අපගේ ජීවිතයට මෙවන් පදනමක් තිබිය යුතු වේ. එසේ නැත්නම් එය අත්තිවාරමක් නැතිව වැලි මත ගොඩ නැඟූ නිවසක් මෙන්, කඩා බිඳ වැටෙනු ඇත. අපි නිතර ම යහපත කිරීමට අපොහොසත් වූ අපගේ මමත්වය තුළ වැසී සිටින දුප්පත් මැවිලි වෙමු. එහෙත්, දෙවියන් වහන්සේගේ ආදරය අපගේ මෙම දිළිඳු බව සැලකිල්ලට නොගනී. අප සතු විශාල ම දුර්වලකම වන්නේ, දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයන් පිළිබඳ ව සැබෑ ලෙසින් විශ්වාස නොකිරීම යි. දෙවියන් වහන්සේ කෙරෙහි දැල්වුණු අපගේ බලාපොරොත්තුව නිවා දැමීමට කිසිවකුට හැකියාවක් නොමැත. උන් වහන්සේ මිනිසත් බව ගත්තේ, පව්කාර අප උදෙසාත්, අප සමඟ ජීවත් වීම සඳහාත් ය. අප සැම දෙනාව ම මවා ඇත්තේ, දෙවියන් වහන්සේගේ ස්වරූපයට අනුව ය. එහෙත් අප, එක්කෙනෙක් අනෙක් පුද්ගලයාගෙන් වෙන් වීමට හේතුව වී ඇත්තේ පාපය යි. පාපය මිනිසාව, ඔහුට ම සමාන වූ අනෙක් මිනිසුන්ගෙන් ද, මුළු මැවිල්ලෙන් ද එක්තරා අන්දමකට ඈත් කරවා ඇත. මේ හේතුව නිසා එනම්, මිනිසා සතු ව කලින් තිබූ පාපය නිසා ඔහු නැති කර ගත්, දේව ස්වභාවය යළි ඔහුට අත්පත් කර දීම පිණිස දේව වචනය මාංසගත විය. ආරම්භයේ දී, දෙවියන් වහන්සේ ලෝකයත් එහි ඇති සියල්ලත් මවන ලද්දේ සිය වචනය ඔස්සේ ය. මාංශගත වූ දේව වචනය (වචනයේ තෙම) හෙවත්, මානුෂිකත්වය ගත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට යළිත්, අප අහිමි කරගත් දේව ස්වභාවය ලබා දුන් අතර උන් වහන්සේ තුළ අපි යළිත් එක්සත් වූයෙමු.

අපගේ ආදි මව්පියන් වූ ආදම් සහ ඒව කරා, සර්පයෙකු විලසින් පැමිණුණු, දුර්පරීක්ෂාව මෙන් දෙවියන් වහන්සේගේ ආදරය පිළිබඳව අවිශ්වාස කිරීමෙහි දුර්පරීක්ෂාව නිරන්තරයෙන් ම අප සමඟ ද වන බැවින්, එතුමන් සම්බන්ධව හා එතුමන්ගේ ආදරය සම්බන්ධව කථා කිරීමට අපට හැකියාවක් නැත. ක්‍රිස්තියානි අප සතුව ඇති ලොකු ම දුර්පරීක්ෂාව වන්නේ, අධෛර්යට පත් වීම යි. අපි අප ගැන සැකයක් ඇති කර ගත යුතු නොවේ. දෙවියන් වහන්සේ කෙරෙහි අප තුළ ඇති බලාපොරොත්තුව තුළ අපට සියල්ල කළ හැකි වේ. "මා බලවත් කරනා සමිඳාණන් තුළ සියල්ල කළ හැකි වේ". අපගේ දුර්වලකම් හේතුකොට ගෙන ඉතා ම පහත් අන්දමේ පාපකාරී තත්ත්වයකට අප ඇද වැටුණ ද, දේව ආදරය කෙරෙහි අප සතුව ඇති බලාපොරොත්තුව නැති කරගත යුතු නොවේ. දෙවියන් වහන්සේ අපට ආදරය කරන බවත් අපි විශ්වාස කිරීමට උත්සාහ ගනිමු. දෙවියන් වහන්සේ ප්‍රිය කරනුයේ මුළුමනින් ම තමන් ව අමතක කර දමා, අන් අය ගැන සිතන ආත්මයකට යි. එබැවින්, අපගේ දුර්වලකම් හා අවිශ්වාසකම් නිසා දෙවියන් වහන්සේගෙන් සැඟවී නොසිට බැහැපත්කමින් යුතු ව අපගේ දුර්වලකම් පිළිගනිමින්, නිරතුරුව ම උන් වහන්සේගේ ආදරය පිළිබඳ ව මෙනෙහි කිරීමට අපි උත්සාහ ගනිමු. අපි සැම දෙනා හොඳ කතෝලිකයන් යනුවෙන් පැවසුව ද, එකිනෙකා තනි තනිව ම අවංක ලෙසින් සිය හෘද සාක්ෂිය පරීක්ෂා කර බැලුවහොත් අපි කෙතරම් අවිශ්වාසවන්ත ද, දේව ආදරයට පටහැණි වූ ක්‍රියාවන් කොපමණ ප්‍රමාණයක් අපි කර ඇති ද යන්න අපට ම තේරුම් ගත හැකි වේ. "අහෝ මාගේ දෙවිඳුනි, මාගේ සමිඳුනි, මට මාගේ පාපයන් වටහා ගැනීමටත්, මාගේ අසල්වැසියා විනිශ්චය නොකිරීමටත් අවැසි වරම් දුන මැනව".

ශුද්ධවූ ඒෆ්‍රම් තුමාගේ යාච්ඤා තුළ මෙසේ පවසයි. අපි ලෝකය තුළ ජීවත් වන තාපසයෝ වෙමු. අප දැකිය යුතු වන්නේ අන් අයගේ වැරදි නොව අපගේ ම වැරදි ය. අපගේ වැරදි දැක ඒවා වෙනුවෙන් අවංකව ම මනස්ථාපනය වන විට අපට සමාව ලැබේ. ආදරය තුළ ජීවත් වන්නා තමන් ම විනිශ්චය කිරීම තුළ දේව ආදරය දිනා ගන්නා බව, ශුද්ධ වූ පාවුලු තුමා පවස යි. යමෙකු වැරදි කරනවා දුටු විට ඔහුට චෝදනා නොකර, ඔහු වෙනුවෙන් යාච්ඤා කළ යුතු ය. අපි කරන්නේ කුමක් දැයි අපගේ හදවත්වලින් විමසා බලමු.

ලැරින් ප්‍රියානි
පහළ දුම්මලසූරිය - මාදම්පේ.

# යමෙක් ඔබට කුමක් කරනවාට කැමති ද? ඔබත් එසේ ම කරන්න. (මතෙව් 7 : 12)



ප්‍රේමය නම්,

ආරම්භයේ දී පුරුෂයා හා ස්ත්‍රිය ලෙස වෙන් ව සමාජීය චර්යාවන් ඇතිව මවන ලද මිනිසා එකිනෙකා හා බැඳ තබන අදෘශ්‍යමාන යදම ප්‍රේමය යි. එය විරුද්ධ ලිංගිකයන් කෙරෙහි, ජනනියන් හා ජනිතයන් කෙරෙහි, ලේ බැඳීම් කෙරෙහි සහෘදයන් කෙරෙහි සහ කිතුනු හෝ අන්‍යාගමිකයන් තුළ තම දැනීම පරිදි ස්වකීය ශාස්තෘන් කෙරෙහි අප සියලු දෙනා තුළ ස්වයංජාත වෙයි. ප්‍රේමය නැමැති පාදම මත ගොඩ නැගුණු දහමේ අනුගාමිකයන් ලෙස අපි එකී ස්වයංජාත ප්‍රේමය අභිභවා යන මානුෂීය හැඟීමක කොටස්කාරයන් වීමට බැඳී සිටිමු. එනම් අපට ප්‍රේම නොකරන අයට ප්‍රේම කිරීමට ය. අපේ විරුද්ධවාදීන්ට, අප ප්‍රතික්ෂේප කරන්නන්ට, අපව පීඩාවට පත් කරන්නන්ට ප්‍රේම කරන්නට ය.

"මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" යැයි ක්‍රිස්තුන් වහන්සේ එදා අපට ආරාධනා කළේ එකී ප්‍රේමයට සාක්ෂි දරන්නට ය. එතුමන්ගේ ශ්‍රී ශරීරයෙන් හා ශ්‍රී රුධිරයෙන් එඩේරික සංකල්පය මත ගොඩ නැගුණු කිතුනු සභාව තුළ එක ම ප්‍රසාද ස්නාපනයක් ලබා එක ම සදාතන ජීවිතයක් බලාපොරොත්තු වන අපි එකී ප්‍රේමයේ කොටස්කරුවන් වන්නට ද බැඳී සිටිමු.

ආරම්භයේ සිට අද වනතුරු අපි පියාණන් වහන්සේගේ ප්‍රේමය විවිධාකාරයෙන් අත්දකිමු. ඒවගේ පාපයේ සිට අද මේ මොහොත වන තුරු අප උන් වහන්සේත් උන් වහන්සේගේ ප්‍රේමයත් ප්‍රතික්ෂේප කළෙමු. උන් වහන්සේ පීඩාවට පත් කළෙමු. උන් වහන්සේට විරුද්ධව නැඟී සිටියෙමු. එහෙත් ප්‍රේමයේ මැවුම්කරුවාණෝ ස්වකීය පුත්‍රයා මිදුම්කරු කොට අප වෙත එවූ සේක. උන් වහන්සේගේ ස්වරූපයට මවනු ලැබූ අප එකී ලෝකෝත්තර ප්‍රේමයේ සාක්ෂිකරුවන් විය යුතු නොවේ ද?

"ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරයි නම් එහි ඇති ඵලය කුමක් ද? පව්කාරයෝ පවා එසේ කරති" (ලූක් 5 : 32) යි වදාළ සමිඳාණෝ එකී ලෝකෝත්තර ප්‍රේමයට සිය ජීවිතයෙන් සාක්ෂි දැරූහ. කෙසේද යත්, තමන් පාවා දෙන්නට යන ජුදාස්ව ම ස්වකීය ශ්‍රාවකයෙකු ලෙස තෝරා ගත් සේක. අන්තිම භෝජනයේ දීත් ඔහුගේ දෙපා දොවා සිපගත් සේක. එසේ කළේ ඔහුගේ පාපයෙන් ඔහු නිදොස් කර නිදහස් කිරීමට ය. එහෙත් ක්‍රිස්තු ප්‍රේමය හඳුනා නොගත් ජුදාස් මරණය තෝරා ගත්තේ ය. තුන් වරක් සමිඳුන්ව ප්‍රතික්ෂේප කළ ද පේදුරු තුමා එකී ප්‍රේමය හඳුනා ගත් නිසා අපේ පර්වතය කොට අපි සලකමු. කුරුස ගසේ දී පවා සිය රුධිරයෙන් ස්වකීය මිනීමරුවෙකු අන්ධ බවින් මුදා ගත් සේක. "මොවුන් කරන වරද නොදැන කරන හෙයින් මොවුන්ට කමා කළ මැනව" (ලූක් 23 : 34) යැයි සිය විරුද්ධවාදීන්, පීඩාකරන්නන් වෙනුවෙන් යාච්ඤා කළ සේක.

ඒ උතුම් වූ තැනැන් වහන්සේගේ භෝජනයට නිරන්තර පංගුකාරයන් වන අප ද උන් වහන්සේගේ ලෝකෝත්තර ප්‍රේමයට සාක්ෂි දැරීමට උත්සාහ කළ යුතු ය. පියාණන් වහන්සේගේ මැවිල්ලේ කොටසක් ලෙස සකල මනුෂ්‍යයා ම පියාණන් වහන්සේගේ දයාබර දරුවන් බව අප නිතර සිහි කර ගත යුතු ය. වෙන් වෙන්ව අප සියලු දෙනා ම උන් වහන්සේගේ මැවිල්ලේ පංගුකාරයන් ද, උන් වහන්සේගේ විමුක්තියේ උරුමකරුවන් ද බව සිහි තබා ගත යුතු ය. එදා සිය සොයුරු ආබෙල්

මරා දැමූ කායින් කිසිවෙකු විසින් විනිශ්චය නොකරන පිණිස පියාණන් වහන්සේ ම ඔහු පිට ලකුණක් තැබූ සේක. (උත්. 4 : 15) සහෝදරයාගේ ඝාතකයා වූ කායින් කෙරෙහි එතරම් දයා දැක්වූ තැනැන් වහන්සේ අපේ විරුද්ධවාදීන් වෙනුවෙන් කෙතරම් දයා වෙනු ඇත් ද?

"යමෙක් ඔබට කුමක් කරනවාට කැමති ද? ඔබත් එසේම කරන්න" (මතෙව් 7 : 12) යැයි වදාළ ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් ලෙස අප අපේ විරුද්ධවාදීන් කෙතරම් ප්‍රේම කළ යුතු ද? සදාතන ජීවිතයේ හවුල් උරුමකරුවන් වන අප අපේ සහෘදයන් හා ඔවුන්ගේ යහපත වෙනුවෙන් මෙන් ම අපේ විරුද්ධවාදීන් හා ඔවුන්ගේ යහපත වෙනුවෙන් ද වග විය යුතු නොවේ ද? (ලූක් 22 : 51) මල් උයනේ දී පේදුරු තුමා විසින් කන කපනු ලැබූ සොල්දාදුවා කෙරෙහි සමිඳුන් දයාව දැක්වූ සේ අපිත් අපේ විරුද්ධවාදීන් වෙනුවෙන් යාච්ඤා කරමු. අපව පීඩාවට පත් කරන්නන්ට, අපව ප්‍රතික්ෂේප කරන්නන්ට සාමය පතමු.

- මන් ද, පියාණන් වහන්සේගේ බලාපොරොත්තුව අන්තිම දවසේ දී සියලු ම මනුෂ්‍යයන් ගලවනු ලැබීම වන බැවිනි (ජොහන් 6 : 39).
- ඔබගේත් මගේත් ගමනේ අවසානය පෙර නො ඇසූ විරූ පෙර නො දුටු විරූ පාරාදීසයක සදාකාලික සාමාජිකයන් වීම බැවිනි.
- අපේ සහෘදයන් මෙන් ම අපේ විරුද්ධවාදීන් ද එකී පාරාදීසයේ හවුල් උරුමකාරයන් වන බැවිනි.
- ක්‍රිස්තුවරයාණෝ ප්‍රකාශ කළ එඩේරික සංකල්පය තුළ අප සියලු දෙනා වෙනුවෙන් වග වීමටත් වග කීමටත් බැඳී සිටින බැවිනි.

යාච්ඤාවෙන්, බලාපොරොත්තුවෙන් ජීවිතය තුළ මානුෂිය ප්‍රේමය මෙන් ම ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ ලෝකෝත්තර ප්‍රේමයත් අත් විඳින්නට උත්සාහ කරමු.

නිසංකා ප්‍රියදර්ශනී
කහටවිල.

## අකීකරු පුතුන් වත් - ඒ මේ ලෙසින් වත්

මේ ලෙස කරනු එය එය ලෙස කරනු එපා
කැඩුවෙමි ඔබේ ඔවදන් මම යොදා උපා
යම් යම් වැරදි දැක වුව විරුදාවක් නොපා
දුනි ඔවදන්ව ඔබ සෙනෙහස් සිනහ පපා

අත රන් මසුය මුලු සුර ලොව මා අත ය
යන එන තැන කොතැන ලොව ඇස් මා වෙත ය
සුරඹුන් වන් ලියන් ළඟ නිති මී විත ය
උන් දෙන රැගුම් හැම මගෙ රන් මසු මත ය

වැහි නැති කල දි දිය උල්පත් සිඳී යයි
පරවෙයි කුසුම් ගස් වැල් වියැළිලා යයි
උන් හැම ගොසින් නො සිතමි මට මෙසේ වෙයි
දහවල් මැදියමෙන් ලොව අඳුරු වී යයි

කරමි ද කුමක් මස්සක් අත නැති කලෙක
රැකියාවක් ලැබිණි ඌරන් ගොවිපළෙක
උන්ගේ අහර විය මගෙ අහර ද විටෙක
මම පැටළුණෙමි මා ගැන සිතුවිලි වැලෙක

පුතු ලෙස හිමි කොටස ගෙන තම අතැර පියා
උස් තුඟු නුඹට සිත් සතුටින් ඉගිළ ගියා
රිසි ලෙස ගෙවන්නට දිවි බැමි නිවසෙ තියා
ආ මගෙ සිහින බිඳුණා පෙණ බුබුළු නිසා

දැසි දැස්සෝ බුදිති රස හර පිය නිවසේ
ඌරන් අහර මේ ලෙස බුදිනෙමි දුක සේ
පිය සිත බිඳිමි විඳිනෙමි දඬුවම් මෙලෙසේ
කළ දොස මහත් මම එහි යන්නෙමි කෙලෙසේ

දුක්බර වෙමින් සෑණ සිතිවිලි අතැර පියා
සේවකයෙකු ලෙසින් වත් ගනු ඇතැයි පියා
සසල සිතින් වුව මං පිය ගෙදර ගියා
ඔහු මා බදා ගත්තා මගෙ පුතේ කියා

මගෙ ලොකු පුතේ ඇයි නුඹ අමනාප සිතින්
මගෙ පොඩි පුතා නුඹෙ මල්ලී යළි ඇවිදින්
සතුටට පුතේ හොඳ තර ගවයකුගේ මසින්
මහා සාදෙකට එක් වෙමු සතුටු සිතින්

ලි. හියුබට් ඇ. ප්‍රනාන්දු - කඳාන.

# වසර 200කට පෙර ශුද්ධාසනීය පිළිගැනීමට ලක් වූ නිර්මල මරියානුවෝ



ක්‍රි.ව. 1782 අගෝස්තු මස 01 වන දින දකුණු ප්‍රංශයේ ප්‍රොවාන්ස් නම් ගම්මානයේ උපත ලැබූ බිලිඳෙකි චාල්ස් ජෝසප් එව්ජින් ද මැසනඩ්. ක්‍රි. ව. 1789 දී ඇති වූ ප්‍රංශ විප්ලවයේ දී එම රාජ්‍යයේ ජීවත් වූ කතෝලිකයින් අධිරාජයාගේ දැඩි පළිගැනීම්වලට ලක් විය. එම හේතුවෙන් එව්ජින් ද මැසනොඩ් පවුල ප්‍රංශයෙන් රහසිගතව නික්ම ගොස් ඉතාලියේ සිසිලිය නගරයේ පදිංචි වූහ. එතුමා 1811 දෙසැම්බර් මස 21 වන දින පදවි පූජකතුමෙකු ලෙස පූජාත්වර වරම් ලැබී ය.

අනතුරුව 'ප්‍රොවාන්ස් හි ධර්මදූතවරු' නමින් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එතුමා ආරම්භ කළේ ය. මේ කාලයේ දී මැසනඩ් පියතුමා රෝමයට ගොස්, එකල ශුද්ධාසන ප්‍රාප්ත ව සිටි XII වන ලියෝ පාප් වහන්සේට තම සංඝය ගැන විස්තර සහිත වාර්තාවක් ඉදිරිපත් කළේ ය. විශේෂයෙන් ම එහි පරමාර්ථය, තේමාව සහ අවශ්‍යතාව ගැන කරුණු පැහැදිලි කළේ ය. ඒ සියල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් 1826 පෙබරවාරි 17 වන දා මැසනඩ් තුමාගේ සංඝය "නිර්මල මරියාවන්ට කැප කළ ධර්මදූත 'ඔබ්ලේට්වරු'"යන නම දරන නිකායක් වශයෙන් එහි ව්‍යවස්ථාව ශුද්ධාසනය විසින් අනුමත කරන ලදී. එතැන් සිට වර්තමානය දක්වා අභියෝග ජය ගනිමින්, දුෂ්ටාත්ම බලවේග පරාජය කරමින් වසර 200ක් ලෝකයේ පුරා දිළිඳු වූවන්, කොන් වූවන් සොයා යමින් ආධ්‍යාත්මික ගමනක ඔවුහු නිරත වෙති.

## නි.ම.නි. ආධ්‍යාත්මිකත්වය

ලක්වාසීන් නිර්මල මරිය නිකායික පියතුමන්ලාව පෙර දිනයේ හැඳින්වූයේ කුරුස ස්වාමිලා ලෙස ය. එහෙත් වර්තමානයේ එම නාමය භාවිත වීම සිදු වන්නේ අල්ප වශයෙනි. නූතනයේ ඔබ්ලේට් පියතුමන්ලා ලෙස බොහෝ දෙනා ව්‍යවහාර කරති. ශුද්ධාසනයේ අනුමැතිය ලත් නිර්මල මරිය නිකාය ඉන් පසුව සමීප වූයේ ගිහියන්ගේ ආධ්‍යාත්මිකත්වය ගොඩනැංවීම කෙරෙහි ය. ඔවුන්ගේ ආත්මික පාඨය වූයේ 'පළමුව මනුෂ්‍යයෙකු විය යුතු ය. දෙවනුව ක්‍රිස්තියානි භක්තිකයෙකි. තෙවනුව ශුද්ධවන්තයෙකි' යන්න යි. එතුමන් රචනා කළ නිර්මල මරිය නිකායේ ව්‍යවස්ථා පොත එම ප්‍රතිපත්ති එලෙස ම පවත්වා ගනිමින් කාලීන අවශ්‍යතා අනුව අනුගමනය කරන ක්‍රමවේද යුගයට ගැළපෙන අයුරින් පවත්වා ගෙන යයි.

## අපෝස්තලික සේවාවන්

එව්ජින් ද මැසනඩ් තුමන්ගේ කැඳවීමේ ජීවිතය තුළින් එතුමා දුටු සේවාවන් බොහෝ ය. ශ්‍රී ලංකාව තුළ ද එම සේවාවන් ක්‍රියාවේ යෙදවීමට නිර්මල මරියානුවෝ සමත්ව සිටිති. එම දූත සේවාවන් බොහෝ දුරට ව්‍යාප්ත වන්නේ දිළිඳු, කොන් වූ, ප්‍රතික්ෂේප වූ ජනතාව වෙනුවෙන් ය. ඔවුන්ගේ සේවාවන්ගේ සම්පිණ්ඩනයක් පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකි ය.

1. මීසම් සේවාව
2. ආරෝග්‍ය ශාලා ආත්මික සේවාව
3. මා පිය සෙනෙහස අහිමි වූ දරුවන් සංවර්ධනය
4. තරුණයන් සඳහා කාර්මික පුහුණුව
5. තරුණ තරුණියන් සඳහා මැසනඩ් යොවුන් සංවිධානය
6. නි.ම.නි. පැවිදිවරුන්ගේ මා පිය සංගමය
7. "භක්ති ප්‍රබෝධනය" සඟරාව
8. මාම් සංවිධානය (නිර්මල මරිය නිකායික ගිහි දූත සේවාව)

9. අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම නි.ම.නි. සේවාවන් අතරට එක් වේ.

ශුද්ධාසනයේ අනුමතය ලබා වසර 200 සංවත්සර ජුබිලි මංගල්‍යයට සමගාමීව ඉහත කණ්ඩායම් සාමාජික සාමාජිකාවන් එක් වූ ආධ්‍යාත්මික පෝෂණ වැඩමුළුවක් පසුගිය දා මට්ටක්කුලිය මැසනඩ් නිවසේ දී පැවැත්වුණි. එම පූර්ව සූදානම් වීමේ වැඩසටහනේ දී දිව්‍ය පූජාව, අධ්‍යාත්මික දේශන, කණ්ඩායම් සාකච්ඡා යනාදිය තුළින් නිර්මල මරිය නිකායේ කරිස්මාව පවත්වාගෙන යාම කෙරෙහි වැඩි අවධානය යොමු විය.

**එස්. හේමාල් පෙරේරා**
**නිර්මල මරිය ගිහි දූත සේවා සාමූහිකය,**
**සාන්ත විසෙන්ති නිවාසය, මග්ගොන.**

# පරිසරයට ආදරය කරමු



ආදරය දෙයක් නොව හැඟීමකි; සිතුවිල්ලකි. එම හැඟීම එක්තරා සීමාවකට කොටු කර තැබිය නො හැකි ය. ලෝකයටවත් මේ විශ්වයටවත් සීමා කළ නො හැකි ය. දෙවියන් වහන්සේගේ ආදරය අසීමිත ය. උන් වහන්සේගේ ආදරය කොතරම් ද යත් තමාගේ එක ම පුතාව අපට දුන් සේක. දුක් විඳ කුරුසියේ මරණයට කැප කළ සේක. ඒ අපට ඇති අසීමිත ආදරය නිසා ය. අපගේ ගැලවීම උදෙසා ය.

දෙමව්පියන්ගේ, ගුරුවරුන්ගේ, සහෝදර සහෝදරියන්ගේ, මිත්‍රයන්ගේ ආදරය ද අපගේ ජීවිතවලට අත්‍යවශ්‍ය ය. ආදරය නැතිව අපට ජීවත් වීමට නො හැකි ය. අපගේ ආදරය මෙලෙස මිනිසුන් අතර පමණක් පවතින ආදරයක් නො විය යුතු යි. තමාගේ සුරතල් සතාට මෙන් ම වැවූ, ගහකොළවලට මෙන් ම පරිසරයේ සිටින සෑම සතෙකුට ම සෑම ගහ කොළයකට ම අප ආදරය කළ යුතු යි. දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය නිසා මෙම ලස්සන ලෝකය තුළ ලස්සන පරිසරයක් අපට ලබා දී ඇත. දෙවියන් වහන්සේ දුන් පරිසරයේ වටිනාකම මැනීමට මිනුම් දඬු නොමැත. පරිසරයේ පවතින ජීව ගුණය, අපට ජීවත් වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා ලබා දෙයි. වාතය, ජලය, ආහාර, ඖෂධ පරිසරය තුළින් අපට ලැබේ. කොළ පාට ගස් කොළන් මඟින් අප අවට වාතය පිරිසිදු වෙයි. පිරිසිදු වාතය අප ව ජීවත් කරවයි. වර්ෂාව මඟින් ඇළ දොළ, ගංගාවලට ලැබෙන පිරිසිදු ජලය ළිං මඟින්, නළ මඟින් අපට ලැබේ. පිරිසිදු ජලය අපව ප්‍රබෝධමත් කරවයි. ජලය නැතිව අපටද ජීවත් වීමට නො හැකි ය.

අපගේ මේ පරිසරයේ උපදින සෑම ගහක්, කොළක්, වැලක්, මලක් ම අපගේ ආහාරයකි; ඖෂධයකි. මෙවන් වූ පරිසරයකට අපි ආදරය නොකර, ඒ වටිනා ප්‍රභවය දූෂණය කරනවා නම්, විනාශ කරනවා නම්, එය අප අපගේ දෙමව්පියන්ට කරන අනාදරයක්, හිංසාවක් හා සමාන ය. ඊටත් වඩා එය දෙවියන් වහන්සේට ගරු නොකිරීමකි. දෙවියන් වහන්සේ ලෝකය මවා, "ඒදන් උයන වගා කර එය රැක බලා ගැනීම පිණිස, දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක" (උත්පත්ති 2:15).

එම නිසා මේ පුංචි අපි අපගේ ජීවිතය බඳු පරිසරයට ආදරය කිරීමට පුරුදු විය යුතු යි. අනාගතයේ ලස්සන ලෝකයක් බිහි වීමට නම් පරිසරයට ආදරය කරන්නන් බිහි විය යුතු යි. එම නිසා පුංචි අපි පරිසරයට ආදරය කරන්නෝ වෙමු.

**දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු**
**7 වසර, ශා. ජෝශප් විදුහල, මරදාන.**

# සිත්තම (කෙටි කතාව)

ගුරුතුමී පන්තියට ආවේ ලස්සන හිනාවක් එක්ක. ළමයින් දඩිබිඩි ගා නැගිට්ටා. ගුරුතුමීගේ දෑස පන්තිය සිසාරා ඇවිද්දා.

"ආයුබෝවන් ළමයි..."

"ආයුබෝවන් ටීචර්..."

"කෝ... මේ... දිල්කා... අදත් නැද්ද... ?"

"ආයෙත් එයා එන්නෙ නෑ... ටීචර් එයාගෙ අම්මා එයාව කාටදෝ බාර දීලා රට යනව ලූ... අස්වීමත් අරන්... දිල්කා ඊයෙ අඬ අඬා කිව්වා... ටීචර්ට කියන්න කිව්වා..."

"අනේ... එහෙනම් ඒකයි මේ ටිකේ ම ආවේ නැත්තේ..." ගුරුතුමී සුසුමක් හෙලුවා.

"හ්ම්... අපි පාඩම පටන් ගනිමු..."

ඇය දිල්කාව අතීතයට එක් කළේ කරන්න දෙයක් නැති හන්දා. ඒ අතර දිල්කා, අම්මගෙන් සමුගන්න බව ඒ අය දැන හිටියේ නෑ.

"පුතේ... මම අවුරුද්දකින් එනවා... මේ නෝනයි, මහත්තයයි කියන විදියට ඉන්න ඕනෑ... දන්නවනෙ... අපට සල්ලි නැහැ... මං සල්ලි ටිකක් හොයා ගෙන එන්නම්..." කඳුළු වරුසාවක් මැද දෙන්නා වෙන් වුණා.

දිල්කා, අලුත් භාරකරුවන් එක්ක වාහනයට නැග්ගේ ඉදිරිය ගැන චකිතයෙන්. ඈ දැන හිටියා ඇයට වහලියක් වෙන්න සිදු වන වග. තාත්තෙක් නැතිව අවුරුදු දහයක් තිස්සේ අම්මා විඳි ගැහැට ඇයට සිහි වුණා. දිල්කා හිත දැඩි කරගත්තත් කඳුළු ගැලිල්ල නතර වුණේ නැහැ. වාහනේ ඇතුළෙ කවුරුත් කතා නෑ. ටික වේලාවකින් වාහනය නතර වුණේ ලස්සන මල් ගොමුවක පිහිටි අපූරු විශාල ගෙයක් ඉදිරියෙ. කඳුළු නතර වුණේ පුදුමය හිතට රිංගු හන්දා.

"බහින්න දරුවො... අද ඉඳලා ඔයා ඉන්නෙ මෙහෙ..." දිල්කා බැස්සා. ඇට හිතුනේ 'අද ඉඳලා මෙහෙ වැඩකාරී මං' කියල විතරම යි. මොනව කරන්නද අම්මා එනකල් ඉන්න තැනක් තියෙනවනේ" ඈ හිතුවා. වාහනෙන් බැහැලා නෝනගෙ පිටුපසින් ඈ හීනෙන් වගේ ඇවිදගෙන ගියා. ගේ ඇතුළෙ වයිවාරණ භාණ්ඩ දැක්ක ම ඈ හිටි තැන නැවතුණා. අඩිය ඉස්සරහට ම තියාගන්නත් අමතක වුණා.

"තරුෂි මේ ළමයව එක්කං යන්න..."

මහත්තයගෙ හඬින් නෝනයි දිල්කයි දෙන්නම කලබල වුණා.

"එන්න... එන්න... දරුවො මං ඔයාව කාමරේට එක්ක යන්නෙ..." දිල්කා විස්මයෙන් විස්මයට පත් වෙලා. නෝනා, දිල්කව එක්කන් ගියේ රෝස පාට ලස්සන පුංචි කාමරයකට. රෝස මල් ඇතිරිල්ලක් දැමූ ඇඳක්, රෝස පාට මේසයක්, අල්මාරියක්, පුටුවක් නියමිත තැන්වල ස්ථානගත කර තිබුණා. දිල්කාට හිතා ගන්න බෑ.

"මෙන්න දරුවො ඔයාගෙ කාමරේ... නම දිල්කා කිව්වනෙ..."

"ඔව්... ඔව්... මැඩම්... මේ මගෙ කාමරේ... අනේ මට හොඳ වැඩි..." මැඩම් සිනාසුණා ය.

"ඔව්... දිල්කා ඔයාගෙ... ඔයා හිතුවෙ අපි ඔයාව වැඩකාරකමට ගත්ත කියල ද...? නෑ... හැබැයි ඔයාට වැඩකුත් තියෙනව තමයි... ඔය බෑග් එක බිමින් තියල එන්නකො..." ඊළඟට එයාලා ගියේ වෙන කාමරයක් ළඟට.

"ඔයා ඔහොම ඉන්න... මං කතා කළාම එන්න..." දිල්කගෙ හිත ගැහෙන පටන් ගත්තා.

"ඇතුළට එන්න දුවේ..." දිල්කට තවත් පුදුමයි. ඈ හෙමින් හෙමින් ඇතුළට ගියා. ඒකත් හරිම ලස්සන කාමරයක්. ජනේලෙ ගාව රෝද පුටුවක පිරිමි ළමයෙක්.

"පුතා... මේ පාර නම් ඔන්න හොඳ යාලුවෙක් ගෙනාවා..."

"යාලුවෙක්... මට එපා... ඒ... කෙල්ලෙක්... මට එපා... එක්කන් යන්න... ගැනු යාලුවෝ එපා... කොයි යාලුවත් දිගට ම ඉන්නෙ නැහැනෙ...

එක්කන් යන්න..." ඔහු බෙරිහන් දෙන්න පටන් ගත්තා... දිල්කා හොඳටම බය වුණා.

"පුතා... මෙයා යාලුවෙක් ම නෙවේ... ඔයාට අක්කෙක්...අපි එයාව හදා ගන්නෙ ම දුවෙක් විදියට... එයාට කාත් කවුරුත් නෑ... එයාගෙ අම්මා රට ගියා... හරි ඔයා අකැමති නම් මෙහාට එවන්නෙ නෑ... අපි යමු දුවේ..."

දිල්කාට කිසි දෙයක් තේරුම් ගන්න බැරිව ගියා. කොහොම හරි හෙමින් හෙමින් දිල්කා අහම්බෙන් ලැබුණු අලුත් ජීවිතයට හැඩ ගැහුණා. ගෙදර රෝද පුටුවේ හිටි පුතාට ඇස් දෙකම පේන්නේ නෑ. ගෙදර වැඩිහිටියො දිල්කාව ළඟ තිබුණු පාසලකට ඇතුළත් කළා. ආබාධිත පුතා දිල්කාගේ සාමකාමී පැවැත්මට අනුගත වුණා ටික දවසක් යද්දී. ඇ පාසල් නිමා වී ආ ගමන් ඔහු ළඟට වී පාසල් විත්ති කියන්න පටන් ගත්තා. ටිකෙන් ටික ඔහුටත් පාසල් යාමේ ආශාව ඇති වුණා. දෙමාපියන්ට පුදුම සතුටක්.

"තරුෂී... මේ දිල්කා දුව ආවත් හරි ගෙදර පිරිලා වගේ. අපේ පුතත් හරිම සන්තෝෂෙන්... දැන් ඉස්කෝලෙ යන්නත් ඕනෑ ලු..."

"අනේ... ඔව් සුනිල්... දිල්කා කියන්නෙ එයාට මල්ලිව එක්ක යන්න පුළුවන් කියලා... ඔයා අද ප්‍රින්සිපල් එක්ක කතා කරන්න... විශේෂ අධ්‍යාපන ඒකකයට දාගත්තොත් හරි..."

ඔන්න අක්කයි මල්ලියි දෙන්නා ඒ කඩඉමත් ජය ගත්තා. දැන් හැමදාම දෙන්නා පාසල් යනවා. දිල්කා නිතරම මල්ලිගෙ ඉගෙනුම් කටයුතුවලට උදව් කළා. මුලදී දිලූෂට දිල්කාව පෙන්නන්න බැරිව හිටියත් දැන් දෙන්නට දෙන්නා හොඳටම ආදරෙන් බැඳිලා. දිල්කාට අම්මගෙ අඩුව නො දැනුණු ගානයි. ඒ වගෙම ඇගෙන් ලැබුණු ලියුම් පවා අඩු වුණා.

දවසක් දිල්කා පාසල ඇරී ආවේ හරි ම සතුටකින්. එදා දිලූෂ පාසල් ගියේ නැහැ. කොහොමත් එයා පාසලට ගියේ සතියට දින තුනක් විතර තමා.

"නැන්දා චිත්‍ර තරගයකට මාවත් තෝරා ගත්තා... මං අපේ මිස්ට කිව්වා මල්ලිටත් අවස්ථාවක් දෙන්න කියලා... ඒත්...! මං ඇවිටිලි කරන්න ගත්තම මිස් කිව්වා, චිත්‍රයක් අන්දන්න කියලා..."

"කොහොම ද දුවේ... මෙයා චිත්‍ර අඳින්නෙ... මෙයා...?"

"නැන්දා ඉන්නකො... මං ඒක බලාගන්නම්... මල්ලිට මුල් කාලෙදි යන්තම් පෙනුණා කිව්වා නෙ..."

දිලූෂගෙ මා පියන්ගේ ඇස් කඳුළින් පිරුණා. දිල්කා ගැන මහා ආදරයකින් හිත පිරුණා. ඉන් පස්සෙ හැමදා ම හවසට දිල්කා, මල්ලිව අරන් වත්තට යනවා. එයාට මල් වර්ග, කොළ වර්ග, ගස් අතපත ගාන්න දුන්නා... ඒ හැඩ හිස් කඩදාසිවල අඳින්න හුරු කළා. ඊට පස්සේ පුංචි ඇණයකින් ඒ රූපවල සීමා සිදුරු නොවන සේ සිදුරු කළා. දිලූෂ ඇඟිලිවලින් ඒවා ස්පර්ශ කරමින් හැඩතල අඳින්න හුරු වුණා. දිල්කා පාට, පාට සායම් වෙන වෙන ම බඳුන්වලට දාලා ඒවා පාට කරන්න උදව් වුණා. ටික දවසක දී සායම් භාජන තියෙන පිළිවෙලින් ඒවායේ පාට නම් කරන්න ඔහුට පුළුවන් වුණා. සමහර වෙලාවට ඇඟ පුරා ම පාට හලා ගත්ත වෙලාවලුත් තිබුණා. ඒත්... ගෙදර අය ඒවා ඉවසුවා... කොහොම හරි ඔන්න දිලූෂගෙ චිත්‍රයකුත් තරගෙට යැවුණා.

ටික දවසක දී නෙළුම් පොකුණ රඟහලේ දී පාසල් ළමා චිත්‍ර තරගයේ සම්මාන ප්‍රදානෝත්සවයට දිල්කාටයි පවුලේ හැමෝට ම යි ආරාධනාවක් ලැබුණා පාසලෙන්. දිල්කාගේ පාසලෙන් තුන්දෙනෙකුට සම්මාන තියෙනවා කියලා ගුරුතුමී කියා තිබුණා. හැමෝම හිතුවා දිල්කාට සම්මානයක් ඇති ම කියලා. එයා චිත්‍රවලට හරිම දක්ෂයි. ඉතින් ගුරුතුමී එක්ක හැමෝම උත්සවයට සහභාගි වුණා. දිවයිනේ හැම දෙසින් ම දරුවො ඇවිත් හිටියා. ඒ ඒ වයස් කාණ්ඩ අනුව ත්‍යාග ප්‍රදානය සිදු වුණා. දිල්කාගේ වයස් කාණ්ඩයෙන් ඇයට රිදී පදක්කමක් ලැබුණා. රන් පදක්කම ගියෙ කොළඹ ලොකු ඉස්කෝලෙකට.

21 වන පිටුවට ...

කැතරින් ගුණවර්ධන

# පවිත් තැවරුණු දෙරණට අවැසි ආදරය

කොතැන වුවත්, වැරහිලි, පටපිලි ඇන්දත් මගේ ම සහෝදරයන් සේ ආදරය කිරීම බොහෝ සේ වටිනා ගුණාංගයකි. ආදරය තෑග්ගක් වන අතර ආදරය තමාට ම දානය කරන තෑග්ගකි. ක්‍රිස්තුන් වහන්සේගේ දිවි පිදීම තව අතකින් අපට පහදා දෙන්නේ දෙවි සමිඳුන් ඉදිරියේ ඇති අපගේ ම ආත්ම වටිනාකම දේව ආදරයට පාත්‍ර වූ බව ය. උන් වහන්සේගේ කුරුසගත වීම මෙන් ම ආදරය කිරීමට ජේසුස් වහන්සේ අපට ආරාධනා කරයි. "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබ ද එකිනෙකාට ප්‍රේම කරන්න" (ජොහන් 15:12). ආත්මාර්ථකාමී කා හට වුව ද එය අතිශයින් ම දුෂ්කර ය. පරිත්‍යාගශීලි ආදරය තුළින් අන් අයට ඇප උපස්ථාන කිරීමට හැකි බව, ක්‍රිස්තු අනුගාමිකයකු වීමේ පෙනෙන්නට තිබෙන සාක්ෂිය යි.

කල්කටාවේ ශු. තෙරේසා මව්තුමිය තම පැවිදි දූතිකාවන්ට දුන් අවවාදය වනුයේ "ඔබ කිතු සමිඳුන් ගැන අන් අයට දේශනා නො කරන්න. ඔබ කළ යුත්තේ ඔබ ම ඔබේ ජීවිත පැවැත්මෙන් ක්‍රිස්තුන් වහන්සේව ඔවුන්ට දිස්වන්න සලස්වන්න. ඔබ අනාථයන්ට සත්කාර කිරීමේ සේවාවල නියැලෙන විට රෝගියෙකුට අසරණයකුට සැනසිලිදායක වදනක් පවසන විට, යමක් කරන විට බාලයන්ට නැණ නුවණ පහදා දෙන විට ඔවුන්ගේ මුහුණුවලට සතුටු කඳුළක් ඇති කරන විට ජේසුස් වහන්සේ අපට ආදරය කරන බව ඔවුන්ගේ සියැසින්, මනසින් දැකගැනීමට හැකි වනවා නො අනුමාන ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසගත වීම ආදරයේ සලකුණක් මෙන් ම සැබෑ ලෙස ආදරය කිරීමට ආදරයේ අපට නො පෙනෙන පැතිකඩක් ද අනාවරණය වේ. ආදරය සමඟ දුක හා වේදනාව සබැඳි ය. මේ ලෝකයේ සැබෑ ම ආදරය ඇත්තේ දෙමව්පියන් හා දරුවන් අතර ය. දෙමව්පියන් තම දරුවන් වෙනුවෙන් අවශ්‍ය වුවහොත් දිවි පිදීමට වුවත් සූදානම් ය. සැබෑ ආදරය යනු එය යි. තාවකාලික සම්බන්ධතා නිසා එම සදාතනික ආදරය කිසිදාක නැති කර නො ගැනීමට වග බලා ගත යුතු යි. ජේසුස් වහන්සේ අපට දැක් වූ අසීමිත ප්‍රේමය නිසා අප වෙනුවෙන් අවසානයේ තම දිවිය ද පුද කළ සේක. එම ආදරයට සම කළ හැකි ආදරයක් මේ ලෝකයේ තවත් කොතැනක හෝ තිබේ ද? ආදරයේ හොඳම පාඩම ජේසුස් වහන්සේ කියා දුන්නේ එදා කුරුස ගසේ දී ය.

**කාමන් සකුන්තලා**
**විලගෙදර.**

# දයා ප්‍රේමය

දයා ප්‍රේමය ඇති තැන, දෙවියෝ වැඩ සිටිනු ඇතැයි කියැවේ. දයා ප්‍රේමයට වඩා විශ්වාස භක්තියට සහ පුද පූජාවන්ට මුල් තැන දෙන්නේ කුමන ආගම ද, එම ආගම සැබෑ දෙවියන්ගෙන් ඉතා ඈත ය. ඇහුම්කන් දීම දෙසවනට පමණක් සීමා නොවී හදවත සහ බුද්ධිය ස්පර්ශ වන්නේ, දයා ප්‍රේමය ඇති තැන ය. කෙනකු අදහස් කරන්නේ කුමක් දැයි එතැන දී අනෙකාට මැනවින් වැටහෙයි. කතාබහ කාරුණික සහ අව්‍යාජ වේ. එකිනෙකා එකිනෙකාට ආලෝකයත් ශාන්තියත් හා මිහිරත් වන්නේ දයා ප්‍රේමය ඇති තැන ය. මවා පෑමක් හෝ විලාසිතාවක් නොවන සැබෑ දයා ප්‍රේමය ඔබ තුළ ඇත්නම්, එය නැති කිරීමට අනෙකකුගේ දුර්ගුණයට බැරි ය. ඔබ තුළ ඇත්තේ සැබෑ දයා ප්‍රේමය නොවේ නම්, අනෙකකුගේ අකාරුණික ප්‍රතිචාරයන් මත එය විනාශ වේ.

දයා ප්‍රේමය නැති තැන වැරදි බහුල වේ. ඇහුම්කන් දීම, දෙසවනට පමණක් සීමා වේ. දයා ප්‍රේමය නැති තැන, කොච්චර කීවත් තේරුම් ගැනීම සිදු නොවේ. එබැවින් තොරතෝංචියක් නැති ව, එක ම දේ දිගින් දිගට ම පැවසීම හෝ නිහඬ ව බුම්මා ගෙන හිඳීම හෝ සිදු වේ. දයා ප්‍රේමය නැති තැන දී, යම් යම් කරුණු ඒත්තු ගැන්වීම පිණිස අතිශයෝක්තිය සහ මුසාව අවශ්‍ය වේ. එබැවින් කතාබහ අව්‍යාජ නොවේ; කාරුණික නොවේ; උද්දච්ච වේ; පදනම් විරහිත විවාද මතු වේ. කාලය යහමින් කා දැමේ. අනිසි ලෙස අපව මෙහෙය වන මායාව අප තුළ දුබල කර, නිසි ලෙස අපව මෙහෙය වන ජීවිතය, දයා ප්‍රේමය වේ.

**සපුගස්කන්දේ රංජිත්**

**ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ ආදරය, 7 වන පිටුවෙන්...**

ක්‍රිස්තුස් වහන්සේ ලෝකයාට දුන් ප්‍රේමය ගැඹුරු ලෙස අවබෝධ කරගෙන අපට ප්‍රකාශ කරන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ආදරණීය ගෝලයා වන ශුද්ධවූ ජුවාම් අපෝස්තුළු තුමා ය. එතුමාගේ ලිපිවල ඇත්තේ උතුරා යන ආදරය යි. ප්‍රේමය යි. එතුමා ලිපි ලිවීමේ දී නිතර ම ආමන්ත්‍රණය කරන්නේ "මාගේ ප්‍රියාදර දරුවනි", "ප්‍රේමවන්තයිනි" යනුවෙනි. එතුමා කියන්නේ ප්‍රේමයෙන් ජීවත් වන්න කියා ය.

"මේ ප්‍රේමය නම් උන් වහන්සේගේ ආඥා අනුව ජීවත් වීම යි. ආඥාව නම් පටන් ගැන්මේ සිට ඔබ ඇසූ ලෙස ප්‍රේමයෙන් ජීවත් වීමයි" (2 ජොහන් 6).

# තෑග්ගෙන් තෑග්ග

සොයයි සමුදුරු රළ වරින් වර වෙරළේ ඇඳි පිය සටහනක්
මකා දා ඒ සේයා අතහැර යළිදු දියඹට යයි වරක්
නොදුටුව ද යළි එකී සලකුණ තෙත් වූ වැලිතෙර කොනැකවත්
දනී පියමන් කෙරූ මිනිසා පසු කෙරූ බව ඒ ඉමත්

වසන්තයක දී යොදුන් සියොතුන් මිහිර ගෙන එති පොදි බැඳන්
හමාරයි උන් වින්ද සිසිලස හැරදා පියඹති ඒ බිමත්
ඇරයුමක් හෝ නෙරපුමක් නොවිය ඇවිත් යන්ටත් නිදහසක්
එවන් හැඟුමකි ආදරය නිදහසේ ලබනා තිළිණයක්

වැරෙන් කිසිවක් ලබා ගැනුමට මාන බල හිඳ නෑ පලක්
එසේ ලද දේ කිසිදු විටක දී නො පෙන්වයි කිසි ප්‍රගතියක්
නීරසින් නො ලද සිත් සුවින් පුදන මට මගේ නොම වූ දෙයක්
තියේ නම් ඒ ප්‍රේමය යි නිමල බොහෝ අගනා ත්‍යාගයක්

'මගේ ම' ය යන වචනයෙහි නම් වේ ශුන්‍ය වූ අර්ථයක්
අහෝ කිසිවක් මගෙ ම කියූ සඳ මලානික ම ය කොයි සිතත්
එකී හැඟුමක වචනාර්ථය 'ආල' බව ම ය නෑ සැකක්
ආල කරනා මාල ගිරවුන් නො දනිති ය නිසි ප්‍රේමයක්

මනිනු ඇසැකින් ආදරය ගැන මිනුම් සොයනා කාලයක්
'අත්හැරීම'ය මිනුම එහි, එය නො දකිනා එක් පැතිකඩක්
නැංගුරම් ලා පැවසුව ද ප්‍රේමියේ මෙමා නුඹේ කැඩපතක්
යන්ට අවසර නො දෙන සිත්හී නොම වේ ය කිසි සැනසුමක්

ආලයෙහි නොවූ ආදරයෙහි වූ මුදුන් මල් කඩ නිදහස යි
නිදහසක් හිමි බැඳීමක් මුල් විහිදී මහ රුකකට සම යි
ඔබ මගේ නොව, මා ඔබේ වග මුමුණනුයේ ඒ අත් බව යි
එකී නිවහල් ආදරේ තුළ සතුට මහ මෙරකට සම යි

**රවිඳු ප්‍රශාන්ත සහෝදර තුමා**
**ජේසු නිකායික ආධුනිකාරාමය, කුරුණෑගල.**

# කිතුනු සාහිත්‍යයේ ප්‍රගතියට මුල් වූ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා



දිනක් උදෑසන ආහාර වේල ගත් නිසා, එය මඳක් බර වැඩි වීම හේතු කොට ගෙන එතුමා එනම් ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා හට නිදිබර ගතියක් දැනිණ. ඉන් අනතුරුව ඔහු සිය මුව පළල් කොට විශාල ඈනුමක් ඇරි අතර එතුමාට නැවත මුව වසා ගැනීමට පුළුවන් කමක් තිබුණේ නැත. එතුමාගේ හනුව විසන්ධි වූ අතර වෙදරාලලා ගෙන්වා ප්‍රතිකාර කළ ද එයින් කිසිදු ප්‍රතිඵලයක් නො ලැබිණි. වර්ෂ 1711 දී එය සිදු විය.

එතුමා එම කාලය තුළ මහනුවර සිටියේ ය. ඔහුට නරේන්ද්‍රසිංහ රජු හා මිතුදමක් ඇති කර ගැනීමට හැකියාව ලැබිණ. මෙම රජතුමාට ලන්දේසි ආණ්ඩුකාරයාගේ රවිකිඤ්ඤයක් තෑගි වශයෙන් ලැබී තිබුණි. එය වාදනය කිරීමට කිසිවෙකුට හැකියාවක් නොතිබූ අතර ගොන්සාල්වෙස් පියතුමාට රජතුමා පණිවිඩයක් යවා, ඊට පසු දෙදිනක් කල් ඉල්ලාගෙන, රජතුමා කරා පැමිණ රවිකිඤ්ඤය වාදනය කරමින් ගීතයක් ගැයූ පසු රජතුමා මෙතුමා කෙරෙහි අතිශයින් පැහැදී තෑගි බෝග ලබා දුන් අතර මෙතුමාට සිදු වී තිබුණු ඉහත සඳහන් ප්‍රශ්නය අසා ඉතා දැඩි ලෙස කම්පාවට ලක් විය. පසුව රාජකීය වෛද්‍යවරයාට ද එතුමා යොමු කළ අතර එතුමාව සුවපත් කිරීමට නොහැකි විය. එතුමාට වචන උච්චාරණය කළ නොහැකි විය. දේශනා කළ නොහැකි විය. මුව විරූපි විය.

මෙතුමා මෙරටට කැඳවා තිබෙන්නේ ජුසේ වාස් මුනිඳුන් ය. ජුසේ වාස් මුනිඳාණෝ මෙරටට වැඩියේ ක්‍රි.ව. 1687 දී ය. එකල කතෝලික පූජකයන්ට දැඩි පීඩනවලට මුහුණ දීමට සිදු වූ අතර කිතුනු කෘතීන් ද විනාශ කෙරිණ. දෙව්මැඳුරු විනාශ කෙරිණ. එදා කිතුනුවන් දැන සිටියේ සාන්ත කුරුස යැදුම හා පරමණ්ඩල යාච්ඤාව පමණි. ජුසේ වාස් මුනිඳුන් පසුව සිය මව්බිමෙන් ධර්මදූතවරුන් කීප දෙනෙක් ලංකාවට ගෙන්වා ගත් අතර පූජකවරු සිව් දෙනෙක් වර්ෂ 1705 මැයි මස 9 වැනි දින දඹදිව ගෝව නගරයෙන් පිටත් වී තලෙයි මන්නාරමට පැමිණ ලංකාවට පැමිණියහ. ඔවුන් මැනුවෙල් මිරැන්ඩා, මිගෙල් ද මේලෝ, ජෝශප් ද ජේසු මරියා හා ජාකොමේ ගොන්සාල්වෙස් ලෙස හඳුන්වා දිය හැකි ය.

මොවුහු දේශනා මාර්ගයෙන් ජනතාව ආධ්‍යාත්මිකව පෝෂණය කළ අතර ඔවුන්ගේ මව් බසට අතිරේකව ලතින්, පෘතුග්‍රීසි හා ලන්දේසි භාෂා ප්‍රගුණ කර ධර්මදූත සේවා සඳහා වුවමනා කරන සෙසු භාෂා ද හැදෑරූහ. ඊට පසුව සිංහල බස ඉගෙන ගැනීමට මහනුවර පැමිණ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙත හා පෙඩි රේ ගැස්කොන් වෙත සම්බන්ධ වූ අතර දස්කොන් අදිකාරම වූයේ මේ ගැස්කොන් ය. ආරම්භයේ සඳහන් කළ පරිදි මෙතුමා සිය හකු ඇටය විසන්ධි වීම නිසා වේදනාවට පත්විය. මෙම රෝග තත්ත්වය නිසා ජුසේ වාස් මුනිඳුන් අපේක්ෂා කරන අන්දමට දේශනාවාදියෙකු වශයෙන් ධර්මදූත සේවාවල නිරත වන්නට මෙතුමාට නො හැකි විය.

එසේ වුව ද ගොන්සාල්වෙස් පියතුමා එයින් සසල නො වී ය. අසරණ නො වී ය. මෙතුමා එයට විකල්පයක් වශයෙන් ලේඛන කලාවට සම්බන්ධ විය. මෙතුමා සිංහල බසින් ග්‍රන්ථ 22ක් සම්පාදනය කළේ ය. ද්‍රවිඩ බසින් ග්‍රන්ථ 15ක් හා ග්‍රන්ථ 6ක් පෘතුග්‍රීසි බසින් ද රචනා කළ අතර ඕලන්ද භාෂාවෙන් එක් ග්‍රන්ථයක් ද ලිවී ය.

මෙතුමාගේ සාහිත්‍ය මෙහෙවර බෝලවත්ත නමැති ගම් පියසේ දී සිදු කෙරිණ. ඒ පමණක් නොව මෙම ග්‍රාමය තුළ දේවස්ථානයක් ඉදි කිරීමට ද ක්‍රියා

කළේ ය. ඒ සඳහා නරේන්ද්‍රසිංහ රජුගේ පූර්ණ අවසරයක් ද මොහුට ලැබිණ. මෙතුමා බෝලවත්ත ග්‍රාමයට පැමිණෙන්නේ එතුමාට තිළිණයක් ලෙස ලැබුණු ඇත් දළවලින් සුසැදි ජේසු බිළිඳාණන් වඩවා සිටින මරිය මාතාවගේ ප්‍රතිමාවක් රැගෙන බව අමතක නොකළ හැකි දෙයකි.

ගොන්සාල්වෙස් පියතුමා රචනා කළ කෘතීන් අතර සුවිශේෂ විසර්ජනය, දුක්ප්‍රාප්ති ප්‍රසංගය, දේව වේද පුරාණය, අඥාන ඖෂධය, දේව වේද සංක්ෂේපය, වේද කාව්‍යය, ආනන්ද කලිප්පුව, මංගල ගීතය, පසන් පොත, සුකෘත දර්පනය, හෙළ කිතුනු සාහිත්‍යයේ අඹරේ සුදිලෙන්නාක් වැන්න. මෙතුමෝ සිංහල කිතුනු සාහිත්‍යයේ පිතෘවරයා ලෙස පිදුම් ලබන්නාහ. එම අමිල මෙහෙවර අප්‍රතිහත උත්සාහයකින් කිරීමට මොහුට අවස්ථාව ලැබුණේ ඉහත දැක්වූ ආබාධයට විකල්පයක් ලෙසිනි. මෙයින් උගත හැකි පාඩම වන්නේ එක් දෙයක් අපට අහිමි වන්නේ තවත් දෙයක් ලැබීමට බැව් සනාථ වන්නකි.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම, කැලණිය.**

**සිත්තම (කෙටි කතාව)**
**16 වන පිටුවෙන් ...**

දිලූෂ අත්පුඩි ගැහුවේ හිටගෙන. ඒ එක්ක ම ඇහුණු නිවේදනයෙන් කෑ ගැස්සුනේ දිල්කාට. ඈ නැගිට්ටේ විදුලි වේගයෙන්.

"ඊළඟට ජූරියේ අති විශේෂ සම්මානය මසැසින් නොපෙනුණත් මනසින් අපූර්ව නිර්මාණයක් ඉදිරිපත් කළ දිලූෂ නේමින්දට... මේ වටිනා රන් පදක්කම ඔහුට යි... මෙන්න ඔහුගේ චිත්‍රය තිරය මත..."

පාට පාට මල් පිරුණු ගොමුවක වූ ලී ගරාදි බංකුවක් මත ගැහැනු දරුවෙකු වාඩි වී සිටින සිත්තම අතිශයින් ම මනහර බව කාගේත් මුහුණුවලිනුත් පෙනුණා. දිල්කා, මල්ලිව හෙමිහිට වේදිකාවට එක්කන් ගියේ සුදු සැරයටියක් එක්ක. ජය ඝෝෂාව කන් බිහිරි කරවන තරම්... දන්නව ද සිතුවමේ ප්‍රස්තුතය ? "ආදරය".



# අත් නොහරින ආදරය...

මම දන්නෙ නෑ මොනවා කරනන්ට ද කියා,
ඉදිරිය මොකක් වෙයි ද කියලා,
මගෙන් මොකක් බලාපොරොත්තු වෙනව ද,
මට තේරෙන්නෙ නෑ...
මට මම අසමත් යැයි දැනෙනවා...
මගෙ දුබල බවත් සමග,
ජීවිතයට මුහුණ දෙන්න මං බය යි...
මම මට මුහුණ දෙන්නත් බය යි...
මම දෙවියන් සොයනවා,
හැබැයි මට දැනෙන්නෙ නෑ,
ඒ ජීවමාන හැඟීම...
මගෙ යාච්ඤාවෙ හිස් බව දැනෙද්දී,
හදවතට හරි වෙහෙස යි...
ඒත් තවමත් මාව අත්හැරල නෑ,
මගෙ නිහඬතාව තුළත්,
මගෙ වැටීම් තුළත්,
ඒ අසීමිත ආදරය පවතිනවා...
මට ඒ දෑත පෙනෙන්නේ නෑ,
ඒත් මා ඒ මත රැඳිලා ඉන්නවා...
සෙමින්, මා සුවපත් කරනවා...
නිහඬව, මට සිනාවක් ගෙනෙනවා...
ඉවසීමෙන්, මගෙ සහායට සිටිනවා...
මට ඒ හැඟීම නොදැනුණත්,
ඒ ආදරය හැමදාම,
මා එක්ක තියෙනවා...

**ගරු කීර්ති සඳරුවන් ප්‍රනාන්දු සහෝදරතුමා,**
**නි.ම.නි. දෙව්සත්හල, අම්පිටිය.**

# LOVING COMPETITION

Some time ago I was following a program called “Voice Kids”. It is a singing program for children between 7 and 15 which originated in Holland and had become very popular in Germany. Today it is in many countries in the world and I was following “Voice Kids, Sri Lanka”. It is a Loving Competition where all work together in collaboration. Some move forward, while others stay back and wish and support those who go forward. The words winners and losers are not generally used. All are animated by a strong family spirit.

The program consists of several stages; blind audition, battle rounds, sing off, quarter finals, semi finals and finals.

At the blind audition the participants sing while the coaches are turning their back to the singer. If the coaches like the singing and intend to support the little singer they will turn to the singer. After the singing every coach will give a feed back to the singer and the singer will choose one of those who turned, to be his/her coach. If no coach turned, the singer is not selected, but goes home after receiving a lot of appreciation and encouragement to participate at the program of the following year.

The coaches will train their singers throughout the program. It is not just a question of singing; they also share with them good human values and teach them about life. At the battle round they present the singers in groups of three. The battle is a loving battle. The three practice together and sing together to the best of their ability so that one of them can go forward. The coaches have the task of preparing the little minds for this letting go. It is beautiful to see how they behave at the announcement of the one selected to go forward. The three wait holding hands and when the name is announced they embrace the one chosen and wish him/her well. Sometimes you can find some in tears because they are not selected but at the same time they rejoice with the one who is selected. Very often the selected one is in tears because he/she has to leave behind the loving companions. One cried out aloud saying “Even though these are not born of my mother they are my brothers and sisters. I cannot leave them behind”. They were not left behind. In the following rounds they were in the audience to support their companion. When those moving forward were interviewed they said their joy was 50% percent because they were sad to leave the brothers and sisters with whom they worked so closely. From time to time, coaches shared some of the comments of the little singers; “The main thing is not the winning but performing to the best of our ability.” “Dear Coach, it does not matter whom you select; we will always love you”. Some called their coach their second father or second mother. One said “the coach is the star of my heart”. There was a strong

bond among the coaches, coaches and the children, and the children among themselves. The coaches took special care to assure those who had to stay back, that they were not defeated. They made them aware of all that they had gained through participation and assured them that the bond created through Voice Kids will always remain strong.

Those who go forward are selected by the coaches who trained them except in the final stages where the first choice is made by popular votes. Even there the second choice is made by the coach. Leaving behind some of the precious little ones was the saddest moment of the program when the coaches struggled and even cried. They always mentioned that they make the choice according to the nature of the program but their heart's desire was to move forward with all.

According to the program no singer stays behind alone. Those who go forward may do so alone or with another but those who stay behind will never be alone. Once, a coach found herself in a difficult situation because there were only two singers for the battle round. Only one is supposed to go forward and one is not supposed to stay behind alone. She decided to move forward with both. It was a very touching moment.

"Grand Finale" was a colourful day. Eight children that came forward form semifinals sang showing great talent. One was chosen by popular vote done through sms. There was no room for doubt; the one selected was the cleverest among the cleverest. When the name was announced there was no rising of fists or cries of victory. The 12 year old Aslam joined hands, raised them to the forehead, and gave a deep bow. Then he looked at his companions who came running to hug him. Everyone rejoiced together. If it were a victory it was everyone's victory.

On the same day every coach sang with each of her/his learners. It was beautiful to see how the little ones were able to perform together with their adult coaches. Some did even better than their coaches. One coach kept saying that his greatest joy was to see his leaner doing better than him.

In our society we find competition everywhere. It is very prominent in sports, education, business, development work and even in religion. Competition pushes people to do better than all the rest. As we have seen on the playground situations competition can lead to cheating and violence. What is actually promoted though competition is egoism. Opposite of competition is collaboration that promotes communion, the family spirit. "Voice kids" has been very thoughtful and creative in producing a program that will help the younger generation to develop talents in a collaborative way, in the spirit of communion.

"Voice Kids" program has come to an end; what remains are the bonds that were created.

**Rev. Sr. Winifreda Wasalathanthrige HF**

# ඕං එහෙනං



ආදරයේ අකුරු හතර මැද සතර සිනහවන් මතු වන්නේ
උක් දඬු දුන්නේ ඊතල සැර මැද හදවත් පසාරු වී යන්නේ
හිල් වුණු හදවතේ ලප් - ඩප් හඬ දැන් බොල් හඬකුයි පතුරන්නේ
ආදරවන්තයින් ලව් කරනා දින ළඟ ඈතක නොම වන්නේ

මුහුදු හුළං මැද දෑත් පටලගෙන ආදරයෙන් මුසපත් වන්නේ
කාලය සමඟින් මුහුද මැදට පැන ජීවිත කාලෙට සමු දෙන්නේ
ආදරයේ මහිමය මේ යයි ලොවට ම හඬ ගා පවසන්නේ
ජීවිත ගමනේ මඟ කෙටි කර ගෙන සෝ ගිනි හැමට ම පතුරන්නේ

ලෝකය මවලා දිය ගොඩ බෙදලා අපා - දෙපා සිවුපා එක සේ ජීවත් වන්නේ
දෙමාපිය ආදරය නිසා බව හිස මුදුනින් අපි පිළිගන්නේ
පාපෙන් මිනිසා ගලවා ගන්නට තම පුතු ලෝකෙට පුද දෙන්නේ
එලෙසින් දෙවිඳුන් මිනිසට ආදරේ යැයි වටහා ගත යුතු වන්නේ

ගව මඩුවක ඉපදී කුරුසිය මරණින් කෙළවර වූයේ
මරණයේ ඉරණම ජීවිතයට එක් කළේ ද ආදරයයි
එය සිහියට ගෙන කටයුතු කිරීම පරම අපේ යුතුකම ම යි
එසේ නොවන අය දෙවිඳුන් පිය හට නිතිදා ගුණමකු වන්නන් ම යි

සොබා දහමට ආදරය නො කළොත් සිදු වන විපත ද බරපතළ යි
ආයෙත් ඒ දේ නොකරන ලෙස කියා දෙන පාඩම බරපතළ යි
ලැජ්ජා තියේ නම් ගස් - වැල් කපන්න, වැලි ගොඩ දාන්න දෙන පාඩම නම් බරපතළ යි
එසේ නොඅසන අධමයෝ ඇත්නම් උලේ තියන එක කළ යුතුම යි

දෙහදක තිබෙනා ආදර කුසුමන් සුවඳ දිදී ලොව සනසන්නා
ඊට හරස් වන භූතයෝ ඇත්නම් සොබා දහම උන් වනසන්නා
ඒ බව තේරුම් අරගෙන කවුරුත් ආදරයෙන් ජීවත් විය යුතු වන්නා
ලස්සන ලෝකය තව ලස්සන වී සතුටු සිනා රැළි පුබුදන්නා


සූරිය මාමා

# ආදරේ පිහිටන්න....

දුකම කඳු මුදුනෙදිත්
ලොකු හිනාවන් මැවූ
ආදරයෙන් බඳාගෙන
නොවැටි සවියක් බෙදූ
ආදරේ බර අවිය
මරණයෙන් පණ පෙවූ
ගැහැණු මිනිසුන් සිටි
මල්වඩම් හිමි නොවූ....


ප්‍රේමයේ පපුව මැද
හරි බරට අඩි තැබූ
හිතක් පපුවක් නැතුව
ඔහේ අත්හැර දැමූ
ප්‍රේමය ම කිමෙක්දැයි
මං මගෙන් ඇසිය යුතු
ප්‍රශ්නයක් තියෙනවා
උත්තරය නෑ සතු....

වැරදුණත්, පැරදුණත්
ආදරෙන් පුරවමු....




චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලංකාව පුරා දසත මනුෂ්‍යත්වයේ, ආදරයේ උල්පත් පිබිදුණු බව අපි දැක්කා. සිදුවුණ විනාශය වළකන්නට තරම් ඒ ආදරයේ දැත් ප්‍රමාණවත් නොවුණත්, මිනිසුන් ලෙස අප තුළ අවදි වූ සහකම්පනය, සංවේදී බව අගය කළ යුතු ම යි.

ආපදා තත්ත්වය නිසා විපතට පත් දූ දරුවන් බැහැදකින්නට බදුල්ල දිස්ත්‍රික්කයේ කළ සංචාරයක දී මට හරිම අපූරු ආදරවන්ත පුතෙකු ගැන අහන්නට ලැබුණා. පියා මිය ගිය නිවසේ මවත්, පුතාත් පමණයි ජීවත්ව සිටියේ. ඔවුන්ගේ නිවස තිබුණේත් කඳු බෑවුමක. අසලින් කුඩා දොළ පාරක් ගලාගෙන ගියා. එදා දවස පරිසරයත් වෙනස්කම් නිසා අම්මාත්, පුතත් විමසිලිලෙන් පසු වූ බව තමයි දැනගන්නට ලැබුණේ. නිවස අසලින් ගලා ගිය කුඩා දොළ පාර ටිකෙන් ටික ප්‍රචණ්ඩ වන බව ඔවුන්ට දැනුණා. එක්වර ම මහා හඬක් නැගෙද්දී ඔවුන් ඉදිරි දොර විවර කර බැලුවා. මහා ජල කඳක්, ඒ හා ආව ගසක් තාප්පයේ වැදීම නිසයි ඒ හඬ නැගුණේ.

"අම්මෙ බයවෙන්න එපා. මං ඔයාව බේරගන්නවා කියල පුතා කිව්වා. එයා මාවත් ඇදගෙන ගේ පිටිපස්සෙ දොරෙන් එළියට පැනගත්තා. උස් කණ්ඩියක් තිබුණා. එතන කොන්ක්‍රීට් බැම්මක් තියෙනවා. මමයි, පුතයි ඒ බැම්මට නැග්ගා. එයා මොන ම වෙලාවකවත් මගෙ අත අතෑරියෙ නෑ. අම්මෙ බයවෙන්න එපා. මං ඉන්නවනෙ කියල එයා මට කිව්වා. ගේ ඇතුළෙන් ආව විශාල වතුර පාර ගෙයි පැත්තකුත් කඩාගෙනයි ගියේ. අපි උන්න බැම්ම වටේ ම වතුර අපි පැය ගාණක් එහෙම ම හිටියා... පුතා මගෙ අත අල්ලගෙන ම හිටියා. ඒක මට ලොකු හයියක්. හැම දේ ම නැති වුණත් මට මගෙ දරුවා ඉන්නවනෙ කියල හිතුණා..."

"වතුර බැස්සට මඩ තට්ටු හැම තැන ම. පුතා මාව තියල මඩේ බැහැගෙන ගෙට ගියා. අපි කලින් ම මගෙ බෙහෙත් ටික යි වටින ලියකියවිලි යි බෑග් එකක දාලා මේසෙ පුටුවක එල්ලල තිබුණෙ. ඒත් හදිසියට ඒක ගන්න බැරිවුණා. වතුර පාරට මේසෙ ලෑල්ල ගැළවිලා බිත්තියට හේත්තු වෙලා. ඒ එක්ක බෙහෙත් මල්ලත් බිත්තියට හිර වෙලා තිබිලා. පුතා ඒක අරගෙන ඇවිත් මාවත් අල්ලගෙන කන්දට බඩ ගෑවා. ඒ උඩහ අපේ මහගෙදර. අපි එහෙට එද්දි තුවාල හැම තැන ම, මඩ නාලා. ඒත් මගෙ පුතා මාව බේරගත්තා".

ඇය ගලන කඳුළු පිසගන්නවත් කතාව නතර කළේ නැහැ. ඒ කඳුළු අපටත් බෝ වෙලා තිබුණා.

"මම ලෙඩෙක්. හැමදාම බෙහෙත් බොනවා. එයා අර මඩේ බැහැල ගිහින් මගෙ බේත් මල්ල හොයාගෙන ආවෙ ඒ හින්දා. හැම වෙලේ ම කිව්වෙ, අම්ම බයවෙන්න එපා කියලම තමයි".

ඒ අම්මා සුරක්ෂා මධ්‍යස්ථානයෙ ඉඳලා මඩ පිරුණු ගේ සුද්දකරන්න යන අතර, අතරමග හමුවෙලා තමයි අපිට මේ කතාව කිව්වෙ.

"ඔයාට පරක්කු වෙනවා නේද? ඔයාට උදව් කරන්නවත් අපට විදියක් නෑ". අපි කිව්වා. මොක ද අපේ කාලසටහන වැඩවලින් පිරිල තිබුණේ.

"ඒකට කමක් නෑ... මට මේ කතාව කියන්නයි ඕනෙ... අපට ගෙදර ආපහු ඉන්න පුළුවන් වෙයි ද නැද්ද දන්නෙ නෑ. ඒත් මට මගෙ දරුවා ඉන්නවා. මගෙ පුතාගෙ ආදරය තමයි මාව ජීවත් කරන්නෙ. ස්තුතියි ඔයාලට මගෙ කතාව අහන් උන්නට".

කුඩා රෙදි මල්ලක් කරේ දාගත්තු අම්මා ලහි ලහියේ යන්න පිටත් වුණා. ඒ අම්මයි, පුතයි ගැන ඇතිවුණ මහා ආදරණීය හැඟීම අදත්, මේ ලියන මොහොතෙත් මගෙ ඇස්වලට කඳුළක් ගේනවා.

ආදර දුවේ, පුතේ...... පොඩ්ඩක් හිතල බලන්න, ඔයාලත් ඒ විදියට තමන් ආදරය කරන අයට හයියක් වුණ අවස්ථා. ආදරය තමයි අපට ජීවිතය දුන්නෙ, ඒ වගේ ම අපිව ජීවත් කරවන්නෙත් ආදරය ම නේ ද?

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 90

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | | 5 | 6 | | | 7 |
| 8 | | | | | 9 | | | | |
| | | | | 10 | | | 11 | | |
| | 12 | | 13 | | 14 | 15 | | 16 | |
| 17 | | | | | 18 | | | | |
| | | | 19 | 20 | | | | | 21 |
| 22 | | | | | 23 | | 24 | | |
| 25 | | | | | 26 | | | | |
| 27 | | | | 28 | | | | 29 | |
| | | | 30 | | | | 31 | | |

හරහට

1. මානව සබඳතා සඳහා අත්‍යවශ්‍ය සාධකයකි.
5. ආදරයේ දී අප එකිනෙකා වෙනුවෙන් සිදු කරන කැපකිරීම මේ නමින් හැඳින්වේ.
8. සමනලයාගේ කීට අවස්ථාව
9. අනුන්ගෙන් නැවත ගෙවන පිණිස ලබාගන්නා මුදල්
12. නැති වූ දෑ සොයා දෙන ශුද්ධවන්තයා
17. මල් මාසය
18. රජවරුන් ජේසු බිළිඳුන් පුදන්නට ගෙන ආ දෙයකි.
19. ශරීරය
22. හිසකේ කොටට කැපූ තැනැත්තා
24. කිසිවෙකුටත් නොපවසන ලෙස අප අන් පුද්ගලයෙකුට කියන්නේ
25. රසදිය මඟින් දිය කරනු ලබන්නේ
26. ආදරය හා සම්බන්ධ සංකේතය
27. අප යම්කිසි දෙයක් පිළිබඳ දරන සංකල්පය
28. සැප්තැම්බර් මාසයට තවත් නමකි.
29. පක්ෂීන්ගේ හොට
30. ආදරයට තවත් නමකි.
31. ආදරයේ දී අනික් කෙනාගේ වරදට ............. දිය යුතු ය.

පහළට

1. මානව ඉතිහාසයේ පළමු මිනිසා
2. ඇතුන්ට ඇත.
3. ඉතා ප්‍රණීත පලතුරකි.
4. සද්ධර්මරත්නාවලියේ සඳහන් "ආඳා ................. තබාලා වල්පත ගත්තා සේ" උපහැරණයේ හිස්තැනට සුදුසු පදය .
5. ජීවය රැඳී ඇත්තේ
6. "වාහනය" යන්නට සමාන පදයකි.
7. ඉන්දියාවේ ඇති ගඟකි.
10. වැඩිපුර ආහාරයට ගැනීම ඉතා නුසුදුසු ය.
11. ගස් මැදීම සඳහා ගසින් ගසට යාමට උපකාරී වන රැහැන්
12. උතුරු අත්ලාන්තික් සාගරයේ පිහිටි රටකි.
13. යාපනයේ අච්චුවේලි ප්‍රදේශයේ ජපමාල තාපස නිකාය ආරම්භ වූ ප්‍රදේශය
14. අතීතයේ හලාවත ප්‍රදේශය ප්‍රසිද්ධ වූයේ
15. බෞද්ධ දර්ශනයේ අවසාන සංධිස්ථානය
16. ගෙලේ පලඳින ආභරණයකි.
20. පියෑඹීමට ආධාර වේ.
21. වාද්දුව ප්‍රදේශයේ ගමකි.
22. දෙවියන්ගෙන් ලැබෙන විශේෂ වරප්‍රසාදය
23. ගමනාගමනය සඳහා යොදා ගැනේ.
28. "භූමිය" යන්නට සමාන වචනයකි.
29. ගරු කටයුතු පිරිමි පුද්ගලයෙක් ආමන්ත්‍රණයේ දී භාවිත වේ.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය, මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 අප්‍රේල් 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 90**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 88 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ලි | යෝ | 2 ටෝ | ල් | 3 ස් | ටෝ | යි | | 4 අ | 5 වි |
| ය | | කි | | ම | | | 6 ප | ත | නා |
| 7 වැ | සි | යෝ | | 8 ර | ක් | ෂ | ණ | | ශ |
| ල් | | | 9 ක | ණ | | | | 10 අ | ය |
| | 11 ව | 12 ග | | ය | | 13 සා | ම | ය | |
| 14 ග | ස් | ල | 15 බු | | 16 කා | ය | | ර් | |
| බ් | | 17 න | ත් | 18 ත | ල | | 19 අ | ල | ස |
| 20 සා | 21 රා | | 22 ත | ත් | ව | 23 ය | | න් | |
| 24 ව | ක් | ක | ල | | | ද | | 25 ත | ඹ |
| | ක | | | 26 කු | ටු | ම් | බ | ය | |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 88 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 88 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - S. W. නිපුන් සිල්වා, 6 ශ්‍රේණිය, සාන්ත වින්සෙන්ති විදුහල, මග්ගොන.
- **දෙවන ස්ථානය** - මෙලිටා පෙරේරා, 13 ශ්‍රේණිය, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.
- **තෙවන ස්ථානය** - රුසේලි ප්‍රනාන්දු, 7 ශ්‍රේණිය, ශු. පවුලේ කන්‍යාරාමය, කළුතර.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 මැයි / ජූනි - "බලාපොරොත්තුවේ අම්මා"**
(2026 මැයි / ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 මාර්තු 15ට පෙර අප වෙත එවන්න.)
**2026 ජූලි / අගෝස්තු - "අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය"**
(2026 ජූලි / අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 මැයි 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2026

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ජනතාවයේ ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය දෘෂ්ටිකෝණයකින් ඉදිරිපත් කර ඇති කෘති දෙක සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.

(i) රූත් කතාව / එස්රා කතාව (ii) එස්තර් කතාව / නෙහෙමියා කතාව

(iii) එස්තර් කතාව / ජොෂුවා කතාව (iv) රූත් කතාව / එස්තර් කතාව

(02) ලේඛනගත වීමට පෙර දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආවේ කෙසේ ද?

(i) ද්විතීක සම්ප්‍රදායෙන් (ii) වාචික සම්ප්‍රදායෙන්

(iii) ලේඛන සම්ප්‍රදායෙන් (iv) පූජක සම්ප්‍රදායෙන්

(03) ශුද්ධවූ සභාව නිරන්තරයෙන් පෝෂණය ලබන්නේ කුමකින් ද?

(i) අපෝස්තුළුවරුන්ගෙන් (ii) පූජකවරුන්ගෙන්

(iii) ශුද්ධාත්මයාණන්ගෙන් (iv) තේවාචාරිවරුන්ගෙන්

(04) "දෙවියන් වහන්සේගේ මිත්‍රයා" යන අර්ථය දෙන වචනය තෝරන්න.

(i) තිමෝතියස් (ii) තිමති (iii) තීතස් (iv) තියෝපිලස්

(05) ශුද්ධවූ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති දෙක සඳහන් පිළිතුර තෝරන්න.

(i) දානියෙල් පොත / එළිදරව්ව පොත (ii) උත්පත්ති පොත / ජොෂුවා පොත

(iii) එළිදරව්ව පොත / නික්මයාම පොත (iv) දානියෙල් පොත / වීරාවලිය පොත

(06) දේව ආදරයේ ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ හා අපගේ ගැලවීමේ සංකේතය කුමක් ද?

(i) ජපමාලය (ii) බොරලික්කම (iii) කුරුසිය (iv) වල්ග තරුව

(07) ගිබියොන්හි පූජාසනය මත දවන යාග පූජා දහසක් පුද කළ රජතුමා කවුරුන් ද?

(i) දාවිත් රජතුමා (ii) හෙරෝද් රජතුමා (iii) II හෙරෝද් රජතුමා (iv) සලමොන් රජතුමා

(08) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) ජෝබ් / ප්‍රේම ගී / මලාකි (ii) ගීතාවලිය / ප්‍රඥාව / මීකා

(iii) හිතෝපදේශය / ජෝබ් / ධර්මදේශකයා (iv) ප්‍රේම ගී / ගීතාවලිය / එස්රා

(09) "තාර්සස්හි" උපත ලැබුවේ කවුරුන් ද?

(i) ශුද්ධවූ ජාකොබ් තුමා (ii) ශුද්ධවූ පාවුලු තුමා

(iii) ශුද්ධවූ අගුස්තීනු තුමා (iv) ශුද්ධවූ ජෙරොම් තුමා

(10) ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා කවුරුන් ද?

(i) ශුද්ධවූ ස්තේපන් තුමා (ii) ශුද්ධවූ මහා ජාකොබ් තුමා

(iii) ශුද්ධවූ සන්තියාගෝ තුමා (iv) ශුද්ධවූ ජුවාම් තුමා

(11) පාවුළු තුමා මිය ගියේ කෙසේ ද?

(i) නීරෝ අධිරාජයාගේ පීඩන සමයේ කුරුසයේ ඇණ ගසා.

(ii) නීරෝ අධිරාජයාගේ පීඩන සමයේ ඝාතනය කර.

(iii) නීරෝ අධිරාජයාගේ පීඩන සමයේ හිසගසා මරා දමන ලදී.

(iv) නීරෝ අධිරාජයාගේ පීඩන සමයේ ගල් ගසා මරා දමන ලදී.

(12) "මුහුදට ගොස් දැල හෙළන්න" යැයි ජේසුස් වහන්සේ පේදුරු තුමාට පැවසුවේ කොහේ දී ද?

(i) බෙතෙස්දා පොකුණ අසල දී (ii) ගෙනෙසෙරෙත් විල අසල දී

(iii) මළ මුහුද අසල දී (iv) රතු මුහුද අසල දී

(13) රදගුරු පදවි ගණන කීය ද?

(i) 11 යි (ii) 36 යි (iii) 10 යි (iv) 12 යි

(14) ඔරතෝරියානු නිකායට අයත් පූජක තුමෙකි,

(i) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා (ii) ජුසේ තුමා

(iii) බොන්ජීං රදගුරුතුමා (iv) මයිකල් රුද්‍රිගු පියතුමා

(15) "ටෝරා" ලෙස හඳුන්වනු ලබන්නේ ?

(i) දිවැසිවර ග්‍රන්ථ (ii) සුවිශේෂ (iii) පංච පුස්තකය (iv) ගීතාවලිය

(16) පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාළ නීති නියෝග පිළිබඳ සඳහන් ව ඇත්තේ කුමන ග්‍රන්ථයේ ද?

(i) ලෙවී ව්‍යවස්ථාව (ii) ද්විතීක නීති සංග්‍රහය (iii) ගීතාවලිය (iv) ප්‍රේම ගී

(17) කතෝලික සභාවට අනුව පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ගණන කීය ද?

(i) 47 කි. (ii) 27 කි. (iii) 72 කි. (iv) 46 කි.

(18) දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා ඇතුළත් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථය තෝරන්න.

(i) 1 හා 2 රාජාවලිය (ii) නික්මයාම (iii) වීරාවලිය (iv) ජෝෂුවා

(19) මව් කුසේ පිළිසිඳ ගැනීම ඇති කරන්නට පෙර පටන් සමිඳාණන් වහන්සේ කැඳවූ දිවැසිවරයා කවුරුන් ද?

(i) යෙසායා (ii) ජෙරමියා (iii) එසකියෙල් (iv) ජෝනා

(20) දේව මාළිගාවේ දී සෙරාප්වරු පිරිවරා සිටි දර්ශනය තුළින් තම කැඳවීම ලබන දිවැසිවරයා කවුරුන් ද?

(i) ජෙරමියා (ii) මීකා (iii) යෙසායා (iv) එලියා

<u>පිළිතුරු</u>

| | | | |
|---|---|---|---|
| (01) iV | (02) ii | (03) iii | (04) iV |
| (05) i | (06) iii | (07) iV | (08) iii |
| (09) ii | (10) i | (11) iii | (12) ii |
| (13) iV | (14) i | (15) iii | (16) i |
| (17) iV | (18) i | (19) ii | (20) iii |

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

# ශුද්ධ ලියවිල්ල අර්ථකථනය කිරීම I

### ශුද්ධ බයිබලය නාමකරණය

ශුද්ධ බයිබලය එක් පොතක් නොව පොත් ගණනාවක එකතුවකි. "බයිබලය" යන වදන ග්‍රීක බසින් ව්‍යවහාර වන්නේ "බිබ්ලියොන්" හෝ "බිබ්ලොස්" ලෙසිනි. එම පොතේ විශේෂත්වය වන්නේ ජුදා සහ ක්‍රිස්තියානි දහම අදහන දෙපිරිස ම එය තම පූජනීය ග්‍රන්ථය ලෙස සැලකීම යි. කඩදාසි සොයා ගෙන නොතිබූ යුගයේ ශුද්ධ ලියවිල්ල සම්පාදනය කරන ලද්දේ 'පැපිරස්' නැමැති තෘණ වර්ගයක් පදම් කර සාදන ලද හැකුළුම් පත්වල ය. පුරාණ මැදපෙරදිග ජනතාව තම ලේඛනය සඳහා භාවිත කර ඇත්තේ හැකුළුම් පත් ය. එම පැපිරස් තෘණ වර්ගය පදම් කර සාදන ලද පොත්වලට බිබ්ලොස් යන වදන යෙදූ හෙයින් ශුද්ධ ලියවිල්ලට බිබ්ලොස් යන වචනය ග්‍රීක බසින් ව්‍යවහාර වේ.

එහෙත් ලතින් බසින් ශු. බයිබලය සඳහා භාවිත වන නාමය වන්නේ "ටා බිබ්ලියා" යන වදන යි. එහි අර්ථය "පොත්" සමූහයකට භාවිත වන නම යි. පසු කාලයේ දී විශ්වීය ක්‍රිස්තු ශාසනයේ නිල භාෂාව ලතින් බස වූ පසුබිමක "ටා බිබ්ලියා" යන වදන "බිබ්ලියා" ලෙස අර්ථ දැක්විය. එහි අර්ථය "පොත් මාතාව" ලෙස ගෞරවාන්විතව වහරන ලදී. මන්ද ශුද්ධ බයිබලය දේව ජනතාවට මවක් මෙන් මඟ පෙන්වන, එය කියවීමෙන් සහ එයට සවන් දීමෙන් ජීවිතය සාර්ථක කර ගත හැකි මඟක් වන බැවිනි.

ක්‍රිස්තියානි ජීවිතයේ උතුම් ම පොත වන්නේ ශුද්ධ බයිබලය යි. මන්ද ඒ ශුද්ධ බයිබලය තුළ දේව වචනය අඩංගු බැවිනි. එම නිසා වෙනත් පොත්වලට වඩා මෙම පොත වෙනස් වේ. එලෙස වීමට හේතු දෙකකි.

1. අනාවරණය වූ දේව වචනය අඩංගු වී තිබීම.
2. එය පමණක් දේවානුභාවයෙන් ලිය වී තිබීම.

### ශුද්ධ බයිබල රචනා වූ භාෂා

ශුද්ධ බයිබලය ලියා අවසන් වීමට වසර 1000 - 1050 අතර කාලයක් ගත වී ඇත. එම කාලය හඳුන්වන්නේ ශුද්ධ බයිබලයේ ලිඛිත කාලය ලෙස ය. ක්‍රි.පූ 2000 සිට ක්‍රි.පූ. 950 දක්වා ඉශ්රායල්වරුන් තම දෙවියන් වහන්සේ පිළිබඳ අත්දැකීම් පරම්පරාවෙන් පරම්පරාවට වාචික සම්ප්‍රදායේ පවත්වාගෙන ආහ. එම කාලය වාචික සම්ප්‍රදාය යි. ක්‍රි.පූ. 950 දී සලමොන් රජුගේ යුගයේ එම වාචික සම්ප්‍රදාය ලිඛිත තත්ත්වයට පත් වීම සිදු විය. ශුද්ධ ලියවිල්ල රචනා වීම අවසාන වන්නේ ක්‍රි.ව. 50 - 100 අතර කාලයේ ය.

ශුද්ධ ලියවිල්ල ලියැවුණ භාෂා 3කි. එනම් හෙබ්‍රෙව්, අරමැයික් (අරාමීය) සහ ග්‍රීක් භාෂාව යි. පුරාණ ගිවිසුම සම්පාදනය වූ භාෂා වන්නේ හෙබ්‍රෙව් හා අරමැයික් ය. එහෙත් නව ගිවිසුම රචනා වීම සඳහා භාවිත වී ඇත්තේ ග්‍රීක් බස යි. පුරාණ ඉශ්රායෙල් ජනතාව හෙබ්‍රෙව් බස භාවිත කළත්, එහෙත් ක්‍රි.පූ. 598 දී පමණ එම ජනතාව බැබිලෝනිය විප්‍රවාසයට නබුකත්නේසර් අධිරාජයා විසින් ගෙන යන ලදී. බැබිලෝනියේ දී ඔවුන් හුරු වූ භාෂාව වූයේ අරාමීය බස යි. එම නිසා බැබිලෝනිය විප්‍රවාසයෙන් පසුව ලියැවුණ බයිබලීය පිටපත් අරාමීය බසින් ලියවී ඇත.

ක්‍රි.පූ. 333 දී ග්‍රීක් අධිරාජයා වූ මහා ඇලෙක්සැන්ඩර් විසින් පලස්තීනය යටත් කර ගන්නා ලදී. ඉන් පසුව ඉශ්‍රායෙල් ජනතාව ග්‍රීක් භාෂාව, ග්‍රීක සංස්කෘතිය, ග්‍රීක ආගමික දෙවිවරු කෙරෙහි යොමු වූහ. ක්‍රි.පූ. 63 දී රෝම සෙනවියකු වූ ගායුස් පොම්පේ පලස්තීනය යටත් කර ගත් පසුබිමක පවා ග්‍රීක් බස ඔවුන්ගෙන් වෙනස් නොවුණි. එම නිසා නව ගිවිසුම මුළුමනින් ම ලියැවී ඇත්තේ ග්‍රීක් බසිනි.

## ශුද්ධ බයිබලයේ කෘති, සම්මත හා ද්වීතිය සම්මත ග්‍රන්ථ

ශුද්ධ ලියවිල්ල කොටස් දෙකකින් යුක්ත ය. එනම් පුරාණ සහ නව ගිවිසුම ලෙස යි. ජුදෙව් හා ක්‍රිස්තියානි දහම අදහන අය පුරාණ ගිවිසුමේ පොත් 39ක් සම්මත ග්‍රන්ථ ලෙස පිළිගනී. එහෙත් කතෝලික සහ ඔර්තඩොක්ස් සභාවන් පොත් 46ක් සම්මත ග්‍රන්ථ ලෙස දේවානුභාවයෙන් ලියවී ඇති බව පිළිගනී. ඒ සඳහා බලපාන ලද හේතු දෙකකි.

1. ජුදා හා ක්‍රිස්තියානි දහම අදහන අය භාවිතයට ගෙන ඇත්තේ මැසරොටික් පිටපත ය. එම පිටපත සමන්විත වන්නේ පොත් 39 කිනි. (මැසරොටික් පිටපත කුමක් දැයි පසුව විග්‍රහ කෙරේ.)
2. කතෝලික දහම අදහන අය භාවිත කරන්නේ සෙප්ටුවාජින්ත පිටපත යි. එම පිටපතේ පොත් 46ක් ලෙස සටහන් වී ඇත. (සෙප්ටුවාජින්ත පිටපත කුමක් දැ යි පසුව විග්‍රහ කෙරේ.)

ඉහත මතභේදයට හේතුව සම්මත ග්‍රන්ථ සහ ද්වීතිය සම්මත ග්‍රන්ථ පිළිබඳ ගැටලුවකි. ද්වීතිය සම්මත ග්‍රන්ථ හේතුවෙන් කතෝලික බයිබලයට පොත් 39 හා තවත් පොත් 7ක් ඇතුළත්ව පොත් 46කි. ඉහත පොත් 7 ජුදා සහ ක්‍රිස්තියානි ආගම් අදහන අය පිළිගන්නේ නැත. එලෙස එම පොත් 7 ජුදාවරු බැහැර කිරීමට හේතුව වූයේ මුල් කිතුනු සභාව ජේසුස් වහන්සේගේ දේවත්වය සහ මෙසියස් වහන්සේගේ කාර්යය සනාථ කිරීමට ද්වීතිය සම්මත ග්‍රන්ථ භාවිත කළ හෙයිනි. ජුදාවරුන් ක්‍රිස්තුන් වහන්සේ මෙසියස් තුමන් යයි සිතන්නේ නැත. එම නිසා ඔවුහු ද්වීතිය සම්මත ග්‍රන්ථ බැහැර කරති.

එලෙස මතභේදාත්මක ගැටලු ඇති වූ පසුබිමක ක්‍රි.ව. 180 දී පමණ ශු. ජස්ටින් තුමා "ජුදෙව්වන් සමඟ සංවාදය" නැමති කෘතිය රචනා කරමින් චෝදනා කරන්නේ ජුදාවරුන් ශුද්ධ ලියවිල්ලේ ඇතැම් කොටස් කපා හැර ඇති බවකි. කෙසේ වෙතත් නිවැරදි තීරණයක් ගැනීම සඳහා ක්‍රිස්තු ශාසනය ජගත් මන්ත්‍රණ සභා කැඳවා මුළු ශුද්ධ ලියවිල්ල ම දේවානුභාවයෙන් ලියා ඇති බව ප්‍රකාශ කරන ලදී. එම මන්ත්‍රණ සභා වන්නේ,

1. ක්‍රි.ව. 393 - හිප්පෝහි මන්ත්‍රණ සභාව
2. ක්‍රි.ව. 397 - කාර්තේජ්හි මන්ත්‍රණ සභාව
3. ක්‍රි.ව. 419 - II කාර්තේජ්හි මන්ත්‍රණ සභාව
4. ක්‍රි.ව. 1441 - ෆ්ලොරන්ස් මන්ත්‍රණ සභාව
5. ක්‍රි.ව. 1545 - ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව

මේ අනුව පුරාණ ගිවිසුම සඳහා සම්මත ග්‍රන්ථ 46ක් ඇති බවට නිල වශයෙන් කතෝලික සභාව පිළිගන්නා ලදී.

## නව ගිවිසුමේ කෘති

නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව 27 කි. එම පොත් කාණ්ඩ 4 යටතේ විග්‍රහ කර ඇත. එනම්,

1. **සුබාරංචි පොත් 4කි.** - ශු. මතෙව්, මාක්, ලූක්, ජොහන්
2. **අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත** - මෙය සභාව ආරම්භය පිළිබඳ විග්‍රහයකි.
3. **පාවුලු තුමන්ගේ හසුන් 13කි.** - රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, එපීස, පිලිප්පි, කොලෝසි, 1 තෙසලෝනික, 2 තෙසලෝනික, 1 තිමෝති, 2 තිමෝති, තීතස්, පිලමොන්
4. **සාමාන්‍ය හසුන් 9කි.** - හෙබ්‍රෙව්, ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, 1 ජොහාන්, 2 ජොහාන්, 3 ජොහාන්, ජුඩිත්, එළිදරව්ව

මෙහි දී හෙබ්‍රෙව් ලිපියේ කර්තෘ අඥාත ය. නව ගිවිසුමේ අවසන් කෘතිය වන්නේ ශු. ජොහන් තුමන්ට එළිදරව් වූ දර්ශනය යි. නව ගිවිසුමේ විශේෂත්වය වන්නේ ජොහන් තුමන් ලියන ලද පොත් 5ක් ඇතුළත්ව තිබීම යි. 1 ජොහාන්, 2 ජොහන්, 3 ජොහන්, ජොහන් සුබාරංචිය සහ එළිදරව් පොත යි. ඒවා ජොහනික දේහයට අයත් පොත් ලෙස සැලකේ.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

# නිර්මල මරියාවන්ට කැප කළ ධර්මදූත ඔබ්ලේට්වරු (ඔබ්ලේට් යන්නෙහි අර්ථය තමන්ව ත්‍යාජ කිරීම යි.)

ශුද්ධ වූ එව්ජින් ද මැසනඩ් උපන්නේ ප්‍රංශ විප්ලවයට සත් අවුරුද්දකට පෙර එනම් 1782 අගෝස්තු මස 01 දා ය.

එතුමා දකුණු ප්‍රංශයේ එක්ස් (Aix) ඇන් - ප්‍රෝවන්ස් නගරයෙහි උපත ලැබී ය. දේව මාතාවන්ට විශේෂ භක්තියක්, ආදරයක් දැක්වූ ඔහු පියතුමකු වී වසර කිහිපයකින් පියතුමන්ලා කිහිප දෙනකු සමඟ එකතු වී **"දිළිඳුන්ට සුබ අස්න දේශනා කරන්න"** යන ක්‍රිස්තු ඉගැන්වීම තම කණ්ඩායමේ දැක්ම කොට ගත් පැවිදි හවුලක් ක්‍රි.ව. 1816 දී ආරම්භ කළේ ය. ඉතා කෙටි කාලයකින් එව්ජින් ද මැසනඩ් පියතුමාගේ මේ ආධ්‍යාත්මික නායකත්වයෙන් ආරම්භ කළ දැවැන්ත ධර්මදූත මෙහෙවරේ ව්‍යවස්ථාව ශුද්ධාසනය පිළිගෙන අනුමත කිරීම ක්‍රි.ව. 1826 පෙබරවාරි 17 දා සිදු වූ සුවිශේෂ සිද්ධියකි.


නිර්මල මරියාවන්ට කැප වූ ධර්මදූත ඔබ්ලේට්වරුන් 1847 දී ලක්දිවට පැමිණියහ. ලෝකය පුරා රටවල් 70ක ව්‍යාප්ත වී ඇති මෙම පැවිදි පංතිය වසර 178ක් පමණ නො නවත්වා විවිධ ක්ෂේත්‍රවල දැවැන්ත අමරණීය මෙහෙවරක් ශ්‍රී ලංකාව පුරා ම දියත් කර ඇත. මේ වන විට සිය ගණනක් පියවරුන් ඇතුළු සහෝදරවරුන් අපෙන් සමු ගෙන ස්වර්ගස්ථ වී ඇත. එම නිසා ම ඔවුන් කළ කී දේට සහ ජීවිත ගමනට දේව වරප්‍රසාදය ලැබුණු අතර එය ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙහෙය වීම තුළ සිදු වූ බව නොරහසකි. අද වන විට දියුණු, නොදියුණු ලෝකයේ විවිධ රටවල නිර්මල මරියාවන්ට කැප වූ ධර්මදූත ඔබ්ලේට්වරු නගරවල මෙන් ම අතිශයින් කර්කශ සහරා කාන්තාරයේ පවා ධර්මදූත කටයුතුවල නිරත වෙමින් සිටිති.

මෙම පැවිදි නිකායට වසර 200ක් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත්තේ දෙවියන් වහන්සේගේ ශුද්ධාත්ම මඟ පෙන්වීමෙන් බව අපට පැහැදිලි ය. මෙරටෙහි ද ධර්මදූත සේවාවේ යෙදුණ සිය ගණනක් විදේශීය සහ දේශීය පියතුමන්ලා ඇතුළු සහෝදරතුමන්ලා මේ ලක් දෙරණ මත මිහිදන් කර ඇත. ඔවුන්ගේ ජීවිත පුෂ්පයන්ගේ සුවඳ ශ්‍රී ලංකාව තුළ තවමත් පැතිරෙමින් පවතී. ඒ සඳහා දෙවි පියාණන්ට තුති පිදීමේ දිව්‍ය පූජාවක් 2026 පෙබරවාරි 17 දා මරදාන පාතිමා දෙව් මැඳුරේ දී පැවැත්විණි. පූජක දිවියේ 46 වසරක් සම්පූර්ණ කළ එයින් වසර ගණනාවක් පාකිස්ථානයේ ශ්‍රී ලාංකික ධර්මදූතයකු වශයෙන් තම සේවාව කළ ගරු මැක්සිමස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා, ශුද්ධ වූ එව්ජින් ද මැසනඩ් මුනිතුමාගේ **ධර්මදූතික ගින්න නැවත අප තුළ දල්වා** ගන්නට අවධාරණය කරමින් ඒ සඳහා අපගේ ව්‍යවස්ථාවේ සහ සම්ප්‍රදායයේ වැදගත්කම මතුකරමින් එදින දේශනය ඉදිරිපත් කළේ ය.

මෙදින ගත් ඡායාරූප කිහිපයක් මතක සටහන් වශයෙන් අපි මෙලෙස එක් කරමු.



**නි.ම.නි. පැවිදිවරුන් සිය සදාකාලික වේද බාර ගැනීමේ දී ඔවුන්ට ප්‍රදානය කරනු ලබන ශ්‍රී කුරුසියේ පළඳනාව**




**නිර්මල මරියාවන්ට කැප කළ ධර්මදූත ඔබ්ලේට්වරුන්ගේ ව්‍යවස්ථාව**

# අපෙන් සුබ පැතුම් !
# Our Best Wishes

**නිර්මල මරියාවන්ට කැප කළ ධර්මදූත ඔබ්ලේට්වරුන්ගේ ව්‍යවස්ථාව ශුද්ධාසනය පිළිගෙන, අනුමත කර වසර 200ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් පැවැත්වූ මංගල දිව්‍ය පූජාවේ ඡායාරූප කිහිපයකි මේ.**



පාතිමා දෙව්මැඳුරේ මෙදින මංගල දිව්‍ය පූජාවට සහභාගි වෙමින්



ගරු ඇලෙක්ස් කොස්තා නි.ම.නි. පියතුමා, කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපති අති ගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා, ගරු සජිත් තිළිණ නි.ම.නි. පියතුමා (වමේ සිට දකුණට)



ගරු මැක්සිමස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා සිය දේශනාව පවත්වමින්



නි.ම.නි. සහෝදරතුමන්ලා ගීතිකා ගායනා කරමින්



මැසනද් යොවුන් හවුලේ තරුණ තරුණියන් සහභාගි වෙමින්



නිර්මල මරිය ගිහි සාමාජිකයන් සිය ධර්මදූත සේවාවට කැප වීමේ ප්‍රතිඥාව දෙමින්



කොළඹ මෝදර "සැමට සරණ" ධර්මදූත මෙහෙවර සංකේතවත්ව ඔබ්ලේට්වරුන්ට නිල වශයෙන් බාර දෙමින්



ශු. එව්ජින් ද මැසනද් මුනිතුමන්ගේ ධර්මදූත ගින්න නැවත අප තුළ දල්වා ගනිමු.



වසර 200කට පෙර ඇරඹුණ නි.ම.නි. ධර්මදූත ගින්න අප හදවත් තුළ නැවත නැවත දල්වා ගමන් කරමු.

මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/MAGAZINE/03/2026